111 වසරක් නොනිවී දැල්වුණු

# දොළොස්මහේ පහන

## දිනමිණ

2020 දෙසැම්බර් 17 බ්‍රහස්පතින්දා





THE DINAMINA






දිනමිණ පුවත්පතෙහි 111වැනි සැමරුම වෙනුවෙන් පිරිනැමෙන විශේෂ අතිරේකය

www.peoplesinsurance.lk

# වාහන දෙකළං වුණාට එළවන අය දුරින් ඉන්න



## හැප්පුන තැන ඉන්නේ නැතුව යන්න තියෙන ගමන යන්න

නව සාමාන්‍ය ජීවන රටාව හේතුවෙන් පුද්ගල දුරස්ථභාවය පවත්වා ගැනීම අත්‍යවශ්‍යයි.
හදිසි අනතුරක් සිදු වුණත් සෞඛ්‍ය රීති පිළිපැදිය යුතුයි.

- හදිසි අනතුරකදී අපගේ Call & Go ක්ෂණික ඇමතුම් අංකයට කතා කරන්න, යන්න තියෙන ගමන යන්න.
- ඔබට හදිසි අනතුරකදී මාස තුනක කල්බදු වාරික
- වන්දි මුදල ඔබේ බැංකු ගිණුමටම
- 80%ක් දක්වා No Claim Bonus

කාර්, මෝටර් සයිකල්, පාසල් වෑන්, ත්‍රිරෝද රථ, ට්‍රැක්ටර් සහ ලොරි වෙනුවෙන් වැඩිම අවදානම් සඳහා ආවරණ අපෙන්




මේ සියලු දේ ඇතුළත්ව
එක පොදියට ආරක්ෂාව

පීපල්ස් ඉන්ෂුවරන්ස් වෙතින්

ඔබ පීපල්ස් ඉන්ෂුවරන්ස් මෝටර් රථ රක්ෂණ හිමිකරුවෙකු නොවේ, නම් අදම පීපල්ස් ඉන්ෂුවරන්ස් රක්ෂණයක් ලබාගෙන මෙම අද්විතීය වරප්‍රසාද අත්විඳින්න.

*කොන්දේසි සහිතයි

PEOPLE'S BANK PLC
මූල්‍ය සමාගම් සමූහයේ සාමාජිකයෙකි

**පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී.**
අංක 7, හැව්ලොක් පාර, කොළඹ 05.
දුරකථන: +94 112 126 126 | ෆැක්ස්: +94 112 126 109
ඊ-මේල්: pilassist@plc.lk

PEOPLE'S INSURANCE
ආදරයෙන් බලාගන්න



# නව පුවත්පතක් ඇරඹෙයි




නිදහස් රටක් නිවහල් ජාතියක් ගොඩ නැගීමේ භාරදූර වගකීමට උරදුන් අපේ රටේ පුවත්පත් කලාවේ පෙරගමන්කරුවා වූයේ දිනමිණ පුවත්පත බව අවිවාදිතය. වහල් මානසිකත්වයෙන් මිදී ප්‍රතිපත්තිගරුක ගුණගරුක සදාචාර සම්පන්න සමාජයක් ගොඩ නැගීමට 1909 දෙසැම්බර් 17 වැනිදා සිට දිනමිණ ජාතික පුවත්පතින් අද දක්වා ඉටුවූ යුග මෙහෙවර සුළුපටු නොවේ.


දිනමිණ පුවත්පතේ මුල්ම කතුවරයා වූයේ එච්. එස්. පෙරේරා මැතිඳුන්ය. ඒ මහතා "සරසවි සඳරැස" පුවත්පතේ කතුවරයා වශයෙන් මුලින් සේවය කළේය. තුරුණුවියේදීම පුවත්පත් කලාවට සම්බන්ධවූ පෙරේරා මහතා රට, ජාතිය, ආගම වෙනුවෙන් සිය පැන මෙහෙයවමින් පරාධීන අදහස්වලින් තොර ස්වාධීන ජාතියක් ගොඩනැගීමේ භාරදූර වගකීම වෙනුවෙන් දිවා රෑ නොබලා වෙහෙස මහන්සිවී ක්‍රියා කළ අදීන පුවත්පත් කතුවරයෙකි.

කොළඹ පිහිටි පරමවිඥානාර්ථ බෞද්ධ සංගමයෙන් පාලනය වූ සරසවි සඳරැස පුවත්පතේ මතවාදී අරගලයකදී සර් ඩී. බී. ජයතිලක මැතිඳුන් වෙනුවෙන් පෙනී සිටීම එච්. එස්. පෙරේරා මහතාට රැකියාවෙන් සමු ගැනීමට තරම් එය ප්‍රබල කරුණක් විය.


එදා එච්. එස්. පෙරේරා මැතිඳුන් "සරසවි සඳරැස" පුවත්පතින් නික්ම යෑම "සෑම අඳුරු වලාකුළකම රිදී රේඛාවක්" ඇතැයි යන ප්‍රකට කියමන සනාථ කරමින් දිනමිණ නම් පාඨක ජනමනස පුබුදුවාලූ ජාතික පුවත්පතක් බිහිවීමට අවැසි මූලබීජ රෝපණය වූ බව පැහැදිලිය. සර් ඩී. බී. ජයතිලක යනු මෙරට බෞද්ධ අධ්‍යාපනය මෙන්ම බෞද්ධ විදුහල් බිහිකිරීමට පුරෝගාමී මෙහෙවරක් ඉටුකළ සත්පුරුෂයෙකි. ඉතාම සංවේදී ප්‍රතිපත්තිගරුක ජන නායකයෙකි. එච්. එස්. පෙරේරා මැතිඳුන්ට සිදුවූ අකාරුණික සිදුවීම ගැන සර්. ඩී. බී. ජයතිලක මැතිඳුන්ට පැවැතියේ බලවත් කම්පාවකි. එහෙත් අභියෝගවලට මුහුණදීමට හොඳ කශේරුකාවක් හිමි එච්. එස්. පෙරේරා සමඟ ජයතිලක මැතිඳුන් ගොඩවූයේ මෙරට ධර්ම ශාස්ත්‍රීය දියුණුවේ තෝතැන්නක් වූ පැලියගොඩ විද්‍යාලංකාරය නම්වූ මනරම් පුණ්‍යභූමියටය. එහි එවකට අධිපතිවරයාණන් වහන්සේ වූයේ පෙළ හෙළ ඈ සතු බසෙහි කුශාග්‍ර බුද්ධිමතෙකු වූ රත්මලානේ ශ්‍රී ධර්මාරාම නම්වූ යතිවරයාණන් වහන්සේය.


උන්වහන්සේ හමුවී මේ සියලු පුවත් උන්වහන්සේට සැලකර සිටීමට ජයතිලක මැතිඳුන් මෙන්ම එච්. එස්. පෙරේරා මැතිඳුන් පසුබට වූයේ නැත. ලේඛන කලාවෙන් ඈත්වීමට කිසිඳු අදහසක් නොමැති බව මෙහිදී වැඩිදුරටත් ධර්මාරාම මාහිමිපාණන් වහන්සේට එච්. එස්. පෙරේරා පැවසීය.

රත්මලානේ ධර්මාරාම මාහිමිපාණන් වහන්සේ පිළිබඳව තවදුරටත් තොරතුරු පැවසුවහොත්


රත්මලානේ ශ්‍රී ධර්මාරාම හිමි


එච්. එස්. පෙරේරා මහතා


ඩී.ආර් විජේවර්ධන මහතා


ඩී. බී. ජයතිලක මහතා

තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමිපාණන් වහන්සේගෙන් පසුව පෙරදිග ශබ්ද ශාස්ත්‍රයන්හී කෙළ පැමිණි වියත් හිමිනමකි. උන්වහන්සේගේ අමරණීය ශාස්ත්‍රීය මෙහෙවර ගැන සිහිපත් කිරීමේදී සංස්කෘත මහකවි කුමාරදාසයන්ගේ ජානකීහරණය" පුරාණ සන්න සහිතව ප්‍රතිනිර්මාණය කිරීම ධර්මාරාම නාහිමිපාණන් අතින් ඉටුවූ විශිෂ්ට මෙහෙවරකි. සිංහල භාෂාව වෙනුවෙන් උන්වහන්සේගෙන් ඉටුවූ මෙහෙවර අතර විශේෂ ශාස්ත්‍ර සංග්‍රහය නම් ශුද්ධ සිංහල භාෂාවෙහි පෙර පැවැති න, ණ, ල, ළ, වර්ණයන්ගේ ව්‍යවහාරය සම්බන්ධ රීතිය එළිපෙහෙළි කොට දීම අගනේය. පුරාණ පඬිවරුන්ගේ කෘති පවා විවේචනයට බඳුන් කළ ඩබ්ලිව්. ඈෆ්. ගුණවර්ධන මුදලිඳු කුමරතුඟු මුනිදස් සූරීන් පවා ධර්මාරාම මාහිමිපාණන්ගේ න, ණ, ල, ළ හේද අක්ෂර වින්‍යාසාත්මක හෙළි දරව්ව විශිෂ්ටතම ශාස්ත්‍රීය සේවාවක් වශයෙන් ඇගැයුමට ලක් කළහ.

උන්වහන්සේ ඉදිරියට තැබූ පය ආපස්සට නොගත් ධීරවීර ගතිවලින් හෙබි යතිවරයාණන් වහන්සේ නමකි.

සර් ඩී. බී. ජයතිලකයන් හා පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන අතර ඇත්තේ ද අවියෝජනීය සබඳතාවයකි. රත්මලානේ ධර්මාරාම මාහිමිපාණන්ගේ ගුරුදේවයාණන්වහන්සේ වූ රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මාහිමිපාණන් වෙතින් සිංහල, පාලි, සංස්කෘත, ඉතිහාසය වැනි විෂයන් මැනවින් හැදෑරූ සර් ඩී. බී. ජයතිලකයන් පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේ ආදි සිසුවෙකි. මහනුවර ධර්මරාජ, කොළඹ ආනන්ද වැනි විදුහල්වල විදුහල්පති ධුරයත් රජයේ ස්වදේශ කටයුතු අමාත්‍ය ධුරයත් දැරූ ජයතිලකයන්.

රට, ජාතිය, ආගම වෙනුවෙන් මහඟු මෙහෙවරක් ඉටුකළ ජාතික නායකයෙකි. එච්. එස්. පෙරේරා ද පහළ හේවාගම් කෝරළයට සම්බන්ධ ජාති හිතෛෂියෙකි. දෙස, බස, රැස ගැන තිබූ උනන්දුව ඔහු අදීන පුවත්පත් කතුවරයකු බවට පත් කළේය. මේ සියලු සාධක සැලකිල්ලට ගැනීමේදී දිනමිණ නම් වූ ඒ අදීන සාරගර්භ පුවත්පත බිහිවීමට මේ යුගපුරුෂයන් තිදෙනාගෙන් ඉටුවූයේ අපමණ මෙහෙවරකි.

රත්මලානේ ශ්‍රී ධර්මාරාම මාහිමිපාණන්වහන්සේගේ මුවින් පිටවූ දිනමිණ නම් වූ ඒ ප්‍රාණවත් අරුත්බර අකුරු සතර දශක ගණනාවක සිට ඉතාම නැවුම් අයුරින් අලුත් පත්තරයක්සේ දිනෙන් දින ඉදිරියට යන්නේ උන්වහන්සේගේ වාග් ශක්තියේ බලමහිමයත් සමඟය. දිනමිණ මංගල කලාපයේ සියලු කටයුතු සිදු කෙරුණේ ප්‍රවීණ නැකැත්කරුවන්ගේ හා පඬිහිමිවරුන්ගේ උපදෙස් පරිදිය. අකුරු ඇමිණීම, යන්ත්‍රගත කිරීම, යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමාදී කටයුතුවලදී පුරාණ චාරිත්‍රවලට මුල්තැන දීමට අමතක නොකළේය. මුල්ම කතුවැකිය ලියන ලද්දේ ද ඉෂ්ටාර්ථ සිද්ධිය සැලසෙන අක්ෂරයකිනි. නැකැත් ශාස්ත්‍රය පිළිබඳ හසල දැනුමක් තිබූ හිමිනමක් වූ තංගල්ලේ නාහිමියෝ නැකත දීමට යුහුසුළු වූහ. සුභ මොහොතින් දිනමිණ යන අකුරු සතර අමුණන ලද්දේ කැලණිය හුනුපිටියේ ඒ. බී. පීරිස් විසිනි. පීරිස් මුලින් වැඩකළේ සරසවි සඳරැසේ මුද්‍රණ ශිල්පියා වශයෙනි. හුනුපිටිය විජයසුන්දරාරාම විහාරස්ථානයේ දායකයෙකු වූ පීරිස් වසර විස්සකට ආසන්න කාලයක් දිනමිණට සිය දායකත්වය දුන්නේය. කොළඹ පළමුවැනි හරස් වීදියේ නොම්මර 29 දරන ලිපිනයේ වූ රොබට් බටුවන්තුඩාව මහතාට අයත් ලංකාභිනව විශ්‍රැත යන්ත්‍රාලයේ දිනමිණ මුද්‍රණය කළ අතර, 1909 දෙසැම්බර් 17 වැනි සිකුරාදා මංගල කලාපය පාඨක ජනයාගේ අතට පත්විය. එය අඟල් 19 ½ X 13 ප්‍රමාණයේ පිටු හතරකින් යුක්ත විය. පිටපතක් ශත 3ක් වූ අතර අවුරුද්දකට දායක මුදල රුපියල් අටකි.

ප්‍රධාන කර්තෘ එච්. එස්. ගේ අදහස වූයේ හැකිතාක් අඩු මිලට මහජනයා අතට පුවත්පතක් දීමය. පුවත්පතක ජීවනාලිය පාඨකයා බව ඔහු තරයේ ඇදහුවක් විය.

දිනමිණ පුවත්පතේ ඓතිහාසික යුග මෙහෙවරක් ඉටුකළ ප්‍රධාන කර්තෘ එච්. එස්. පෙරේරා මහතාගෙන් පසුව දිනමිණ නොකැඩී නොබිඳී ඉදිරියට රැගෙන යායුතු බව තීරණය කළ සර් ඩී. බී. ජයතිලක මහතා, ඉතාම ප්‍රඥාගෝචර ක්‍රියාවක් සිදුකළේය. එය නම් අපේ රටේ පුවත්පත් කලාවට පුරෝගාමී මෙහෙවරක් ඉටුකළ ඩී. ආර්. විජයවර්ධන මහතාට දිනමිණ පුවත්පත භාර දීමයි.

බාරොන් ජයතිලක ශ්‍රීමතාණන් දුරදක්නා නුවණින් සද්භාවයෙන් ඒ කටයුත්ත ඉටුකළේය. නිදහස් සටන වෙනුවෙන් අනුපමේය මෙහෙවරක් ඉටුකළ ඩී. ආර්. විජයවර්ධන මැතිඳුන් ජාතික සංගමයේ ප්‍රධාන ලේකම්වරයා වශයෙන් ද ඒ මහඟු කාර්යභාරයට උර දුන්නේය. දිනමිණ ජාතික පුවත්පත තුළින් ද ඒ සුවිශේෂ කාර්යභාරය මැනවින් ඉටුකළේය. දිනමිණ පුවත්පතට විජයවර්ධන මහතා දක්ෂ මෙන්ම ව්‍යක්ත ලේඛකයන්ගේ දායකත්වය ගැනීමට පසුබට වූයේ නැත. ඒ අනුව ඩී. ජේ. බී. විජේසේකර, ඇන්. එච්. ජිනදාස, ජේ. වෙත්තසිංහ, ඩී. ඩබ්ලිව්. වික්‍රමාරච්චි, ඇලෙක්සැන්ඩර් වැලිවිට, මාර්ටින්, ජී. බී. සේනානායක, පියසේන නිශ්ශංක ආදීහු කර්තෘ ධුර දැරූහ. දිනමිණ සඳහා ලැබෙන ලිපිවල ව්‍යාකරණ දොස් නිදොස් කිරීමට දොඩන්දූවේ ධර්මසේන පඬිතුමාගේ සේවය ගත් බව ද සඳහන්වේ.

'කොග්ගල මහා ප්‍රාඥයා' නමින් විරුදාවලිය ලැබූ මාර්ටින් වික්‍රමසිංහ මහතා සිය ස්වයංලිඛිත චරිතාපදානය වන "උපන්දා සිට" කෘතියේ දිනමිණ ගැන සඳහන් කිරීමට අමතක නොකළේය. දිනමිණ කතුවරයා වශයෙන් මාර්ටින් වික්‍රමසිංහයන් මෙසේ පවසා ඇත.

"දිනමිණෙහි මා වැඩ කළේ ආසාවෙනි. කොතෙක් මහන්සි වී වැඩ කළත් මට වෙහෙසක් නොදැනිණ. තාගෝර් කවියා ලංකාවට ආවේ 1934 දී යයි සිතමි. ඔහු එනදාට දවසකට පෙර රෑ අටට පමණ වික්‍රමාරච්චි "තාගෝර් ගැන විශේෂ ලිපියක් ලියන්නට පුළුවන්"දැයි මගෙන් ඇසුවේය. මා කන්තෝරුවෙන් යන්නේ රෑ අටට හෝ අටහමාරට පමණය. දුම්රියෙන් ගොස් බැස රෑ දහයට පමණ ගෙදරට ළඟා වෙමි. වික්‍රමසිංහ මහතා දිනමිණේ සේවය කළ යුගය ගැන සඳහන් කොට ඇත්තේ ඒ අයුරිනි. දිනමිණ පුවත්පතට ආවේණික වූ අනන්‍යතාවයක් ඇත්තේය. ඒ ශිෂ්ට සම්පන්න බස්වහරක් ආරම්භයේ සිට අද දක්වා පැවතීමය.

මහා විද්‍යාල, මධ්‍ය මහා විද්‍යාල බවට පත්වූ යුගයේ සිට විදුහල්වල සිංහල භාෂා උගන්වන ගුරුවරුන් සිසු දරුවන්ට සිය භාෂා ඥානය දියුණු කරගැනීමට දිනමිණ පුවත්පත බැලීමට යෝජනා කළේ නිවැරදි බස් වහරකට දිනමිණ පෑ දස්කම් නිසාය. අදට වඩා හෙට ගැන සිතන මාධ්‍ය කලාවක් දිනමිණ සතුව ඇත. එවිට පාඨකයා අතට සෑම දිනකම ලැබෙන්නේ අලුත් පත්තරයකි. නැවුම් අදහස් උදහස්වලට ඉඩදුන්නත් සම්ප්‍රදායට ගරු කරන පත්තර කලාවක් දිනමිණ සතුව ඇත.

අභිමානවත් එකසිය දහනව වැනි උපන්දිනය සමරන මේ මොහොතේ දිනමිණ පුවත්පත පාඨක ජන මනස පුබුදුවාලමින් චිරාත් කාලයක් යෙහෙන් වැජඹේවා.

**මහින්ද ආරියවංශ**

දොළොස්මහේ පහන


# එදා මෙදාතුර දිනමිණ නියමුවෝ



1909 – 1914

## එච්. එස්. පෙරේරා

1909 'දිනමිණ' පුවත්පත ආරම්භ කර සිංහල පුවත්පත් කලාවට අමිල මෙහෙයක් කළ එච්. එස්. පෙරේරා නම් වූ ඒ උදාර මිනිසා 1914 දෙසැම්බර් මස 11 වැනි දින දැයෙන් සමුගත්තේය. ඔහු මැවූ ඓශ්වර්යය අතු විහිදවා රටට සෙවණ සාදන්නේය. ඒ නිසාම එච්. එස්. පෙරේරා අදටත් ජීවමානය.



1935 – 1937, 1944 – 1959

## පියසේන නිශ්ශංක

පනස් වසකට වැඩි කාලයක් තුළ එකම ආයතනයකට සම්බන්ධව සේවය කළ මේ දුර්ලභ පුවත්පත් කලාවේදියා අන් කවරකු හෝ නොව පියසේන නිශ්ශංක සූරීන් පමණක්ම වෙයි. පියසේන නිශ්ශංක මහතා දිනමිණ ප්‍රධාන කර්තෘ පදවියට පත්වූයේ 1935 දීය. විශ්‍රාම ගන්නා තෙක්ම ඔහු "දිනමිණ" ප්‍රධාන කර්තෘ ධුරය හෙබවීය.



1965 – 1969

## ඩී. ඩී. වෙත්තසිංහ

උපාධිධරයකු වූ දොන් ධර්මපාල වෙත්තසිංහ පුවත්පත් කලාවේදියකු වූයේ ඒ පිළිබඳ වූ දැඩි ඇල්ම නිසාමය. ඩී. බී. ධනපාල සූරීන්ගේ ආදරය ලබමින් ඔහු පත්තර කලාව ප්‍රගුණ කළේ කිසිදු අඩුවක් නොතබමිනි." 1964 අගභාගයේදී "දිනමිණ" පුවත්පතේ කර්තෘ වශයෙන් ඩී. ඩී. වෙත්තසිංහ මහතා පත්විය.



1977 – 1978

## එඩ්මන්ඩ් රණසිංහ

අඩසිය වසක් තරම් කාලයක් මාධ්‍ය ක්ෂේත්‍රයේ බල කණුවක්ව වැජඹුණු හෙතෙම දිගු කලක් ඉහළින් වැජඹුණේ සියල්ල බදාගනිමින් නොවේ. තම කර්තෘ ධුරය ද නොයෙක් විට හැර දා යමිනි. කිසිවකුත් පාවා නොදෙමිනි. තම ප්‍රතිපත්ති එඩිතරව රැක ගනිමිනි. 1977 ඔහු "දිනමිණ" කර්තෘ විය. පසුව සිළුමිණ කර්තෘත්වය දරන ලදි.



1995 – 1997

## සරත් කුරේ


සරත් කුරේ මහතා ලේක්හවුස් ආයතනයට එක්වූයේ 1994 දීය. වර්ෂාවසානය වන විට ඔහු "දිනමිණ" කර්තෘ තනතුරට පත් කෙරිණි. ආයතනය රජය සතු වූ නමුදු පුවත්පත සමබරව පවත්වා ගැනීමේ පැහැදිලි අවශ්‍යතාවක් ඔහුට තිබුණේය. ඔහු ඒ වෙනුවෙන් පෙනී සිටියේය.



2002

## තිස්ස එදිරිසිංහ


තිස්ස එදිරිසිංහ මහතා නිවැරදි බස් වහර හා නිවැරදි ව්‍යාකරණය දැඩි නීති පද්ධතියක් ලෙසින් ගරු කළ අයෙකි. ඔහු ආධුනික පුවත්පත් කලාවේදීන්ට ගුරුවරයෙක් ම විය. 2001 දී 'දිනමිණ' හා 'සිළුමිණ' පුවත්පත්වල කළමනාකාර කර්තෘ නම් අලුත් පදවියක් එදිරිසිංහ මහතාට ලැබිණි. 2002 වන විට ඔහු 'දිනමිණ' ප්‍රධාන කර්තෘ ධුරයට පත් විය.



1919 – 1924

## ඩී. ඩබ්. වික්‍රමාරච්චි

'සිංහල බෞද්ධයා', 'දිනමිණ', 'ස්වදේශ මිත්‍රයා', 'සරසවි සඳරැස' සිංහල පුවත්පත්වලත් 'මෝනිං ලීඩර්' හා 'සිලෝන් ඉන්ඩිපෙන්ඩන්' යන ඉංග්‍රීසි පුවත්පත්වලත් ප්‍රධාන කර්තෘ ධුරය සඳහා එකම නමක් සඳහන් වෙයි. එය ඩී. ඩබ්ලිව්. වික්‍රමාරච්චි නාමයයි. එපමණක් නොවේ එතුමා ලඝුලේඛන ක්‍රමයක් ද හඳුන්වා දී තිබේ. එය වික්‍රමාරච්චි ලඝු ලේඛනයයි.



1931 – 1944

## මාර්ටින් වික්‍රමසිංහ

"දිනමිණ" කතු පරපුරේ මුදුන්මල්කඩ ලෙස සැලකිය හැක්කේ මාර්ටින් වික්‍රමසිංහයන්ය. සිංහල පාඨකයන්ට ආගන්තුක වූ බටහිර දැනුම සරල බසින් දිනමිණ හරහා බෙදා දුන් එතුමාට "දිනමිණ" කතුවරුන් අතරේ සුවිශේෂී තැනක් හිමි වෙයි. දිනමිණෙහි පරිවර්තකයකු, විශේෂාංග රචකයකු වශයෙන් පත්‍ර කලා ජීවිතය ඇරඹූ ඔහු පසු කලෙක "දිනමිණ" ප්‍රධාන කර්තෘ පදවියට පත් විය.



1970 – 1973, 1978 – 1979

## ඇස්. සුබසිංහ

ඇස්. සුබසිංහ සූරීන් "දිනමිණ" කර්තෘ පදවිය භාරගත්තේ 1970 දීය. ඉන්පසු ඔහු "නවයුගය", "මිහිර" හා "සතුට" යන වාර ප්‍රකාශනවල කර්තෘ පදවි භාරගත්තේය. ටී. බී. පෙරමුණේතිලක මහතා "දිනමිණ" කර්තෘ පදවියේ වැඩ බාරගත්තේය. 1977 දී ඔහුට නැවතත් "දිනමිණ" මුල් පුටුව බාර විය.



1980 – 1982

## බන්දුල මෙත්තානන්ද


දශක හතරක පහක කාලය තුළ ලංකාවේ දේශපාලන, සමාජීය, සංස්කෘතික, ආර්ථිකමය සිදුවීම් මාලාව දින වකවානු සහිතව මුළුමනින්ම විස්තර කිරීමේ හැකියාව ඔහු සතු විය. ඔහු "දිනමිණ" කර්තෘ පදවියට පත්වූයේ 1980 දීය. පත්තරය කුමක් වුව ද, එහි තනතුර කුමක් වුව ද ඔහු පුවත්පත් සමග බැඳී සිටියේය.



1997 – 1999

## දෙල්තොට චන්ද්‍රපාල


1966 දී 'දිනමිණ' කර්තෘ මණ්ඩලයට ද එක්විය. මෙතුමා පසුකාලීනව විජය ප්‍රකාශන සමාගමට සම්බන්ධ විය. ඔහු එහි දරමින් සිටි ලංකාදීප නියෝජ්‍ය කර්තෘ පදවිය අත්හලේ 'දිනමිණ' කර්තෘ පදවිය භාර ගැනීමටය. ඔහු දිනමිණ පුවත්පතට නව ආලෝකයක් එක් කළ සාහිත්‍යධරයෙකි.



1924 – 1935

## ඇලෙක්සැන්ඩර් වැලිවිට

"දිනමිණ" යනු සිංහල පුවත්පත් ඉතිහාසයයි. එහි සැරිසරන්නකුට දිනමිණ කාර්යාලය කොළඹ චැතම් වීදියේ තිබූ කාලයක් හමුවනු ඇත. එතැන සිට බේලි වීදියටත්, වත්මන් ලේක්හවුස් මන්දිරයටත් දිනමිණ සංක්‍රමණය වෙද්දී පුරා අට වසක් "දිනමිණ" කර්තෘත්වය දැරුවේ ඇලෙක්සැන්ඩර් වැලිවිට මහතාණන්ය. ඒ අනුව ඔහු 1919 දී ජ්‍යෙෂ්ඨ උප කර්තෘ වශයෙන් ඇලෙක්සැන්ඩර් වැලිවිට "දිනමිණ" ට එක්කර ගත්තේය.



1960 – 1964

## ඇම්. ඒ. ද සිල්වා

'දිනමිණ' වංශ කතාවේ 1960 – 1964 යුගය ඇම්. ඒ. සිල්වා මහතාට අයත් යුගයයි. ඇම්. ඒ. දි සිල්වා යනු හැබෑ පෙරළිකාරයෙකි. ඔහු සතු අපූරු පත්තර කලා කෞශල්‍යයක් විය.

1950 දී 'දිනමිණ' පුවත්පතේ කළමනාකාර කර්තෘ ධුරයට පත් ඇම්. ඒ. දි සිල්වා මහතා පියසේන නිශ්ශංක සූරීන්ගෙන් පසු 'දිනමිණ' මහ පුටුවට පත් විය. දිනමිණ කර්තෘත්වය භාරගත්තේ 56 සිදුවූ දේශපාලන පෙරළියේ සමාජ පරිවර්තනය ජනතාවට දැනෙමින් තිබූ යුගයකය.



1974 – 1977

## ටී. බී. පෙරමුණේ තිලක

ප්‍රවෘත්ති ලෝකයේ පෙරමුණේම සිටි ඔහු නමින් ටී. බී. පෙරමුණේ තිලක වෙයි. ඔහු කෘතහස්ත පත්‍රකලාවේදියකු විය. එනිසාම ශ්‍රී ලංකාවේ ප්‍රබල ජාතික පුවත්පත් දෙකකම ප්‍රධාන කර්තෘ පදවිය දැරීමට තරම් වාසනාවන්ත විය. පෙරමුණේ තිලක මහතා පැරණි ටයිම්ස් මන්දිරය අසලම ඔහුගේ ප්‍රවෘත්ති ඒජන්සිය විවෘත විය. විදේශ පුවත්පත් රැසක ශ්‍රී ලංකා වාර්තාකරු වූයේ ඔහුය.



1983 – 1994

## ජී. එස්. පෙරේරා

1974 මැයි 01 දින ජී. එස්. පෙරේරා මහතා විශේෂාංග කර්තෘවරයා ලෙස පත් වූ අතර, 1976 ජූනි 15 "දිනමිණ" නියෝජ්‍ය කර්තෘ බවට පත්විය. 1982 වන විට ඔහු "දිනමිණ" කර්තෘ පදවියට පත්වීමට සමත් විය. මාර්තු 01 දින වැඩබලන කර්තෘ වශයෙන් පත් වූ හෙතෙම, 1982 සැප්තැම්බර් 01 දින කර්තෘ පදවිය ලැබීය. වසර 12 ක් පුරා "දිනමිණ" කතු පදවිය දැරීමට තරම් එතුමා භාග්‍යවත් විය.



2000 – 2002

## බෙනට් රූපසිංහ

බෙනට් රූපසිංහ මහතා ලේක්හවුස් ආයතනයට එක්වූයේ 1994 දීය. එවකට ජනාධිපතිනිය වූ චන්ද්‍රිකා කුමාරණතුංග මහත්මියගේ ඉල්ලීමකටය. ඔහු ප්‍රථමයෙන් "දිනමිණ" සහාය ප්‍රවෘත්ති කර්තෘ විය. අනතුරුව ප්‍රවෘත්ති කර්තෘ, උප කර්තෘ, සහාය කර්තෘ වශයෙන් පියවර ඉදිරියට තැබූ බෙනට් රූපසිංහ මහතා "දිනමිණ" කතුවරයාණන් බවට පත්වූයේ වසර 2000 දීය.



2002 - 2004

## සමන් වගආරච්චි

"යුක්තිය" පුවත්පතෙහි විශේෂාංග කර්තෘ ලෙස ද "ලක්බිම" දිනපතා පුවත්පතෙහි නියෝජ්‍ය කර්තෘවරයා ලෙසද "ඉරිදා පෙරමුණ" පුවත්පතෙහි කර්තෘවරයා ලෙස ද සිංහල පුවත්පත් කලාවෙහි කැපී පෙනෙන සලකුණක් තබන්නට සමන් වගආරච්චි සමත්විය. සමන් වගආරච්චි මහතා 2001 සිට 2002 දක්වා දිනමිණ කර්තෘ හැටියට රාජකාරි කළේය.



2004 - 2005

## සී. දොඩාවත්ත

2004 වසරේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට එක්වෙමින් 'දිනමිණ' කර්තෘ ධුරයට පත්විය. 'දිනමිණ' පුවත්පතේ අන්තර්ගතය හා ආකෘතිය පිළිබඳ වෙනස්කම් රැසක් ඔහු කර්තෘ ධුරය දැරූ කාලයේ සිදුවිණි. දිනපතා අධ්‍යාපන අතිරේක සහ වෙනත් විශේෂ අතිරේක ඇතුළු විශේෂාංග රැසක් දිනමිණට එක්විය.



2011 - 2015
2019 - මේ දක්වා

## ගාමිණී ජයලත්

ගාමිණී ජයලත් මහතා පූර්ණකාලීනව දිනකර පුවත්පතට සම්බන්ධ වී මාධ්‍ය කටයුතු ආරම්භ කළේය. ඉන්පසු දිවයින පුවත්පතට සම්බන්ධ වූ ගාමිණී මහතා ඉන්පසු 1994 වර්ෂයේදී සරත් අමුණුගම මහතාගේ ඉල්ලීම මත ලේක්හවුස් ආයතනයට සම්බන්ධ විය. ඉන්පසුව සම කර්තෘ, කළමනාකරණ කර්තෘ සහ 2011 වර්ෂයේදී දිනමිණ ප්‍රධාන කර්තෘ පුටුව හෙබවීය.



2003 - 2004

## බන්දුපාල ගුරුගේ

1976 දී ඔහු ලේක්හවුස් ආයතනයට බැඳුණේය. 1994 දී යළිත් ඔහු ලේක්හවුස් ආයතනයේ සේවයට පැමිණියේ 'සිළුමිණ' නියෝජ්‍ය විශේෂාංග කතුවරයා ලෙසය. 2001 දෙසැම්බර් පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් පසු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය ලේක්හවුසිය තමා යටතට පවරා ගත්තේය. ඒ අවස්ථාවේදී 'දිනමිණ' කර්තෘ තනතුර බාර ගැනීමට බන්දුපාල ගුරුගේ මහතා ඉදිරිපත් විය.



2005 - 2006

## රන්ජන් අමරරත්න

රන්ජන් අමරරත්න මහතාගේ ලේඛන ජීවිතය ආරම්භ වන්නේ 1977 සිටය. ඔහු එවක සිට 'දිනමිණ', 'සිළුමිණ', 'දවස', 'රිවිරැස' හා Daiy News', 'ඉහද' යන පුවත්පත්වලට ලිපි සපයා තිබේ. ඔහු උපකතුවරයකු ලෙසින් 1995 දී 'දිනමිණ' පුවත්පතට එක් විය.

ඉතා කෙටි කලෙකින් 'දිනමිණ' හා 'සිළුමිණ' යන පුවත්පත්වල සම කර්තෘවරයකු ලෙස සේවය කර ඇත. 2005 නොවැම්බර් 30දා 'දිනමිණ' පුවත්පතෙහි කර්තෘ පදවිය ඔහු වෙත පිරිනැමිණි.



2015 - 2019

## පුෂ්පා රොවෙල්


පුෂ්පා මාධ්‍ය ක්ෂේත්‍රයට අත්පොත් තැබුවේ 1977 දී ලේක්හවුස් ආයතනයට සම්බන්ධ වීමෙනි. ඇය මුලින්ම මධ්‍යම ප්‍රවෘත්ති අංශයට අනුයුක්තවී ප්‍රවෘත්ති කලාව ගැන මනා පරිචයක් ලබා ගත්තාය. එමගින් ලබාගත් දැනුම මත දිනමිණ කර්තෘ මණ්ඩලයට අනුයුක්තවූ ඇය ඒ අනුව උප කර්තෘ, ප්‍රධාන උපකර්තෘ, සම කර්තෘ තනතුරු හොබවමින් 2015 සිට ප්‍රධාන කර්තෘ පදවියට පත් විය. මෙරට ජාතික පුවත්පතක ප්‍රධාන කර්තෘ ධුරයට පත් වූ එකම කාන්තාව ඇයයි.



2003 - 2004

## කරුණාරත්න අමරතුංග

කර්තෘවරයකු ඉතා සියුම් ලෙස කිසිවකුට නොරිදවා ඉවසිලිවන්තව තම ගමන යෑමට උත්සාහ දරයි. එවන් පත්‍ර කර්තෘවරයකු කරුණාරත්න අමරතුංග නමින් අපට හඳුනා ගත හැකිය. කරුණාරත්න අමරතුංගයන් "දිනමිණ"ට ගොඩවුණේ 1993 දීය. වසර 2000 දී ඔහු 'දිනමිණ' සම කර්තෘ පදවියට පත්ව තිබිණි.



2006

## මහින්ද අබේසුන්දර

'දිනමිණ' ජාතික පුවත්පතට අවුරුදු 100ක් වූ මොහොතක 'දිනමිණ' කර්තෘත්වය දැරුවේ මහින්ද අබේසුන්දරය. විද්වත් ලේඛකයකු වන මහින්ද අබේසුන්දර මහතා 2005 දී එවකට තිබූ දේශපාලන වාතාවරණය උඩ ජනමාධ්‍ය අමාත්‍යංශය චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය භාර ගැනීමෙන් පසු 'දිනමිණ' පත්තරයේ කර්තෘ ලෙස පැමිණියේය.



# මහාමේරුවක් සේ නොසැලෙමින් පැමිණි ගමන

"දිනමිණ" ට අදට හරියට වසර 111 කි. සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ (ලේක්හවුස්) පත්තර කලාවේ මහගෙදර වැඩිමලා "දිනමිණ". සැබවින්ම මෙය විස්මය දනවන කරුණකි. වසර 111ක් යනු දිගු කාලයකි. ඒ කාලය තුළ නොකඩවා දිනපතා පුවත්පතක් ලෙස "දිනමිණ" පවත්වාගෙන යාම සුළුපටු කටයුත්තක් නොවේ. ඒ විස්මය අප ඉදිරියට පැමිණ ඇත.

වසර 111ක් පිරෙන "දිනමිණ" පුවත්පතේ වත්මන් කතුවරයා ලෙස කටයුතු කරන්නට ලැබීම මා ලැබූ භාග්‍යයක් ලෙස මෙම මහඟු අවස්ථාවේ සටහන් කරන්නට කැමැතිය. ඊටත් වඩා මා ලැබූ ඉතා වාසනාවන්ත සිද්ධිය ලෙස සටහන් කරනුයේ ඒ "දිනමිණ" අනභිභවනීය පුවත්පතේ කතුපදවිය දෙවරක් දැරීමට තරම් මා වාසනාවන්තයෙකු වීමය.

"දිනමිණ" පුවත්පත 1909 දෙසැම්බර් 17 වැනි දින එළිදක්වා වසර 111ක් ගත වූ තැන සිට ආපසු හැරී බලනවිට අප පුවත්පත පිළිබදව මහා ආඩම්බරයකින් අපේ හදවත් පිරී ඉතිරී යයි. ලේක්හවුස් නිර්මාතෘ ඩී.ආර් විජයවර්ධනයන් ද මේ අවස්ථාවේ අප ගෞරවයෙන් සිහිකරන අතර "දිනමිණ" මහාමේරුවක් සේ නොසැලෙමින් වසර 111ක් පැමිණි මේ ගමන මුළුමහත් පුවත්පත් ලොවේ සැමට ආදර්ශයකි. මඟපෙන්වීමකි. එදා මෙදා තුර "දිනමිණ" කතුපදවිය දැරූ එච්.එස් පෙරේරා කර්තෘතුමන් ප්‍රමුඛ සියලු කර්තෘවරුන් මේ අවස්ථාවේ ගෞරවයෙන් සිහිපත් කළයුතුය. ඔවුන් සියල්ල මේ රටේ දැවැන්ත චරිතය. එතුමන්ලා දිනමිණ මෙහෙයවූ මාවත ඔස්සේ තව තවත් වර්ධනීය තත්ත්වයෙන් "දිනමිණ" මෙහෙයවීම අපේ වගකීම, යුතුකම වේ. "දිනමිණ" ශ්‍රී ලංකාව තුළ මුද්‍රණය කරන අංක එකේ පුවත්පත කිරීමට අපට හැකි නම් එය අප සියල්ල අතීත කතුවරුන්ට කරන ලොකුම ගෞරවය, උපහාරය ලෙස සඳහන් කළහැක. ඒ අභියෝගය මේ අවස්ථාවේ අප කරට අරගෙන ඇත.

"දිනමිණ" කිසිදා ජනප්‍රිය රැලි තෝරා ගත්තේ නැත. ජාතිවාදය, ආගම්වාදය, වර්ගවාදය තෝරා ගත්තේ නැත. මුදල් ඉපයීම එකම බලාපොරොත්තුව වූයේ ද නැත. "දිනමිණ" ට ආවේණික ගමනක් ඇත. "දිනමිණ" රැකිය යුතු දෙයක් ඇත. "දිනමිණ"ට රට ජාතිය වෙනුවෙන් කළයුතු වගකීමක් සේම යුතුකමක් ද ඇත. වසර 111ක ගමනේ දී "දිනමිණ" ට පැමිණි මල් සේම ගල් ද එකලෙස උපේක්ෂා සහගතව බාර ගත්තේය. ඒවා දෙස මැදහත් සිතින් බැලුවේය.

වසර 111 ක් ගතවුවත් දිනමිණ යුග කාර්යභාරය තවමත් අවසන් නොමැත. ඒ නොනිමි මෙහෙවර ඉදිරියට ගෙනයෑමට ලේක්හවුස් වත්මන් සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය දෙන සහාය අතිමහත්ය.

"දිනමිණ" මගේ කාර්ය මණ්ඩලයේ සියල්ල අද දවසේ අප කැපවී ඇත්තේ වඩා හොඳ දිනමිණක්, වඩා හොඳ පත්තරයක් පාඨක ජනතාවට ලබාදීමේ අභිලාෂයෙනි. ඒ අදිටන අපි අනිවාර්යයෙන්ම ජය ගන්නෙමු.

**ආදරණීය දිනමිණ ! සුබ උපන් දිනයක් !!**

**ගාමිණී ජයලත්**
**ප්‍රධාන කර්තෘ - දිනමිණ**

දොළොස්මහේ පහන

# පුවත් පත් අතර දිලෙන මිණි

දේශීය සිනමා ඉතිහාසය පිළිබඳ මෙරට ලියැවුණු බොහෝ සටහන් ආරම්භ වනුයේ කඩවුණු පොරොන්දුව නම් සිනමා කෘතියෙන් එය ආරම්භ වූයේ යැයි සිතාගෙනය. එයින් එහා දේශිය සිනමා ඉතිහාසය පිළිබඳ ලියැවුණු බොහෝ ග්‍රන්ථයන්හි පරස්පර විරෝධී කරුණු එමටය. මෙකී පර්යේෂණ සඳහා ආශ්‍රිත කොට ගත් ඇතැම් මූලාශ්‍ර බොහොමයක් එක් තැනක් කේන්ද්‍ර කොට ගත් ඒවාය. එබැවින්ම මේ බොහෝ ග්‍රන්ථ උපන්ගෙයි දෝෂවලින් යුක්තය. එය වඩාත් පැහැදිලිව පෙනෙන්නේ අපේ සිනමාවේ පැරැණි කරුණු ලෝකයේ සෙසු සිනමා ඉතිහාසය හා සසඳා විමර්ශනයට ලක් කිරීමේදීය. සියවසකට එපිට අතීතය හාරා ගැනීමේ දී එය අත්දුටු කිසිවකු හෝ අප අතර නැත. ඉන්නා වැඩිහිටියන්ගේ මතකය ද ප්‍රශ්නකාරිය. එබැවින් දේශීය සිනමා ඉතිහාසයේ යටගියාව සොයා යමින් සරසවිය පුවත්පත සඳහා ලිපි මාලාවක් ලියන්නට සිතා මූලාශ්‍ර ලෙස පැරැණි පුවත්පත් සොයා ගිය අපට වැදගත්ම තොරතුරු සොයා යන්නට ගෙයින් පිටත, නැතහොත් ලේක් හවුස් මන්දිරයෙන් පිටත යන්නට අවශ්‍ය වූයේ නැත. මේ සොයායෑමේදී ලැබුණු තොරතුරු අතර, අතිශය වැදගත් තොරතුරක් තිබුණේ 1929 වසරේ අප්‍රේල් මස 21 වැනි දිනදීය. ඒ කාලයාගේ ඇවෑමෙන් සදහටම රහසක් වන්නට ඉඩ තිබුණු ලාංකික නිහඬ චිත්‍රපටයක් පිළිබඳවය. චිත්‍රපටය රොමානිස් නම් විය. චිත්‍රපටය නිපදවා තිබුණේ ප්ලාටේ සමාගම මඟින්ය. එදින දිනමිණ පුවත්පතේ මුල් පිටුවෙන් සොයා ගත් මේ ප්‍රවෘත්තිය නොවන්නට මෙරට තිර ගත කළ මුල්ම චිත්‍රපටය පමණක් නොව ඒ පිළිබඳ තොරතුරු ද සදාකාලික රහස් බවට පත් වන්නට ඉඩ තිබිණ. මේ පුවත සරසවිය යළි උපුටා දැක්වීමෙන් මහත් ප්‍රහර්ෂයට පත් වූ මහාචාර්ය සුනිල් ආරියරත්නයන් ඒ පිළිබඳ ප්‍රංශසා කොට ලිපියක් ද එවීය. එහි ගෞරවය හිමි විය යුත්තේ අපට නොව, එදා එම වාර්තාව සඳහන් කොට මතු යම් දවසක මහ නිධානයක් සේ සොයා ගන්නට ඉඩ සැලසූ දිනමිණටය. සිනමා ඉතිහාසය සොයන දිනමිණ පැරැණි පුවත් වාර්තා සොයන කල අපට ලැබුණේ සිනමාව පිළිබඳ සැඟවුණු කරුණු පමණක් නොවේ. ලක්දිව ගෙවුණු ඉතිහාසයයි. අතීතය නිවැරැදිව කියවන්නට නම් ගෙවුණු වකවානුවේ මෙරට ඉතිහාසය පිළිබඳ පුනරාවර්ජනයක් කරන්නේ නම් එයට හොඳම තෝතැන්න දිනමිණ පුවත් සොයා යෑමය.

සිනමා ඉතිහාසයේ දී මෙරට රූපගත කරමින් තිබුණු ජර්මානු සිනමා කෘතියකට නැඟුණ ජනතා විරෝධය, ලයිට් ඔෆ් ඒෂියා චිත්‍රපටය තනන්ට මෙරටට පැමිණි පිරිසට නැඟුණ විරෝධය පමණක් නොව කඩවුණු පොරොන්දුවට පෙරාතුව ශ්‍රී වික්‍රම නමින් තනන්නට ගිය සිනමා නිර්මාණයක තොරතුරු ද සිනමා ඉතිහාසයේ නොලියැවී සැඟවී තිබිණ. ශ්‍රී වික්‍රම නිර්මාණය වූවා නම් මුල්ම සිංහල කථානාද චිත්‍රපටය වන්නට ඉඩ තිබුණේ කඩවුණු පොරොන්දුව නොවේ. එයටත් වඩා එහි අධ්‍යක්ෂණය සඳහා මෙරටට පැමිණ තිබුණේ හින්දි සිනමාවේ දැවැන්තයකු වූ ෂොරාබ් මෝඩි ය.

එපමණක් නොව මෙරට මුල් වරට සිනමා නළු නිළි යුවළක් සමග පුවත්පත් සාකච්ඡාවක් පවත්වා තිබුණේ ද දිනමිණය. ඒ 1929 වසරේ මෙරටට පැමිණි එවකට ලොව ජනප්‍රියම සිනමා ශිල්පී යුවළ ලෙස සැලකුණ ඩග්ලස් ෆෙයාර්බෑන්ක්ස් සහ මේරි පික්ෆෝඩ් සමඟ කළ සාකච්ඡාවය. දිනමිණ පිටු අතර අප සොයා ගියේ සිනමාව වුව ද එය ගෙවුණු ඉතිහාසය පිළිබඳ අප කියැවූ හා අප අසා තිබූ බොහෝ කරුණු යළි විමසා බලන්නට අවස්ථාවක් විය. කොටින්ම ගෙවුණු සියවසේ මහාවංශය ලියන්නට හොඳම මූලාශ්‍රය තිබුණේ දිනමිණේය. (පසුගිය සියවසේ ලියැවුණු මහාවංශය ග්‍රන්ථයේ සිනමාව පිළිබඳ ලියැවුණු කරුණු බොහොමයක් සාවද්‍යය) දිනමිණ කලාවට පමණක් නොව දේශපාලන-සාමාජීය සියලු කරුණු සඳහා අදාළ ය. කොටින්ම දිනමිණෙන් බැහැරව එම ඉතිහාසය ලියන්නට ගිය සියවසේ කිසිවකුට හෝ නොහැකි විය.

ඉතිහාසය නිවැරැදිව ලියන්නට නැතහොත් එයට අදාළ මූලාශ්‍ර සපයන්නට පුවත්පතකට හැකිවීම අතිශය වැදගත්ය. දිනමිණ ලංකාවේ මුල්ම පුවත්පත නොවන මුත් ඉතිහාසය ලියන්නට වගකීම දෛවෝපගත පරිද්දෙන් පැවරී ඇත්තේ දිනමිණටය. ඒ එය සියවසක් ගෙවා ඇති නිසා පමණක් හෝ එහි ඓතිහාසික කාර්යභාරය පමණක් සලකා ලියන්නක් නොවේ. එය එකී සියවස ඇතුළත මුහුණ දුන් ගැටලු අභියෝග සියල්ලම සලකා බැලීමෙන් සඳහන් කරන්නකි. කවර මට්ටමකින් බැලුව ද පුවත්පතක් සියවසක් ඉක්මවා පැවතීම ම අභියෝගයකි. දිනමිණ පළමුව එම අභියෝගය ජය ගත්තේය. එය එම සියවස මුළුල්ලේ පාඨකයා කෙරෙහි පවත්වා ගත යුතු විශ්වාසය මුල්ම සාධකයයි. දෙවැන්න හුදු ආයෝජනයක් ඉක්මවා ගිය ජාතික වගකීමයි. දිනමිණ මේ කාර්යයෙහිලා නැතහොත් එම වගකීමෙහිලා අනලස්ව කටයුතු කළ බව මැදහත් සිතින් බලද්දී නොරහසකි. එහිදී ඒ හා පළවුණු සෙසු සමකාලීන පුවත්පත් පරිශීලනය කළ යුත්තේ එම කරුණු වැඩිදුර විග්‍රහයට හෝ වැඩිදුරටත් සනාථ කර ගැන්මට පමණකි. දිනමිණ පාඨකයන් අතර අතිශය ජනප්‍රිය අවධියකදී එය කියවන පාඨකයන්ට නාඳුනන තුවක්කුකරුවා ඉදිරියේ මරණ දණ්ඩනය නියමවූ කාලයක්ද තිබුණි. දිනමිණ පාඨකයාට ගෙන ගිය වරදට මරණයෙන් දඬුවම් ලද අලෙවි කරුවෝ ද සිටියහ. ඇස් දෙක මෙන් රැක ගත යුතු දිනමිණ පුස්තකාලයේ කොටසක් වරක් මැරයෝ පැන ගිනිලෑවෝය. වරක් ගිනිලෑ බස් රියක් දිනමිණ කාර්යාලයට එවුවේය. ගිනි නිවුණා විනා දිනමිණ වනසන්නට කිසිවකුට හෝ හැකියාවක් වූයේ නැත. ගෙවුණු සියවසේ දිනමිණ අතින් ඇල්ලූවෙකු නොසිටියේ නම් ඔහු මළ පොතේ අකුරක් නොදන්නා මිනිසකු විය යුතුය. නැතිනම් මේ දැන් උපත ලද බිළිඳකු විය යුතුය.

1909 වසරේ අද වැනි දිනක එච්.එස්.පෙරේරා මහතා විසින් දිනමිණ ආරම්භ කරනු ලැබුව ද, එය මෙතුවක් කල් පවත්වා ගෙන යනු ලැබුවේ එයට ජීවය ලබාදුන් ඩී.ආර්. විජයවර්ධන මහතාගේ නුවණට පින්සිදු වන්නටය. දෛවෝපගත ලෙස ශ්‍රීමත් ඩී.බී. ජයතිලකයන්ගේ මැදිහත්වීමෙන් දිනමිණ විජයවර්ධනයන් අතට පත් නොවන්නට එහි ආයුෂ පස් වසරකට සීමා වන්නට ඉඩ තිබිණ. එහෙත් දිනමිණ එහි නාමයේ පරිද්දෙන්ම දීර්ඝායුෂ ලබන්නට වාසනවන්ත වූයේය. කලින් කී පරිද්දෙන් මරණ දණ්ඩනය අතින් ගෙන හෝ දිනමිණ කියවන්නට පාඨකයෝ රැසක් මෙරට සිටියහ. ඒ බව සටහන් කළ යුතු නැත. එමෙන්ම ඒ කිසිවක් හෝ දිනමිණ තරම් අභියෝගවලට මුහුණ දුන්නේ ද නැත.

පිටකොටුවේ පළමුවන හරස් වීදියේ ආරම්භ වන දිනමිණ කලක් මරදානේ ද පසුව කොටුවේ බේලි වීදියේ ද කාර්යාල පවත්වාගෙන ගියත් අභිමානවත් දිනමිණ කාර්යාලය නැතහොත් ලේක් හවුස් මන්දිරයට ගොඩ වදිනුයේ 1929 ජනවාරි මස 26 වැනි දිනදීය. එය ඓතිහාසික සිදුවීමකි. කොළඹ කොටුවේ හදවත බඳු ස්ථානයක දිනමිණ කාර්යාලය ඉදිවීමත් එය දේශිය ගෘහ නිර්මාණ ශිල්පයට මුල් තැන දුන් කොළඹ කොටුවේ එකම ගොඩනැඟිල්ල වීමත් මෙහිලා කැපී පෙනෙයි. එය දිනමිණට පණදුන් විජයවර්ධන නම් විශිෂ්ට මිනිසාගේ දැක්ම පිළිබඳ කදිම සාධකයක් වෙයි. මේ ගොඩනැඟිල්ලට ලේක් හවුස් යැයි නම ලැබෙන්නේ විජයවර්ධන මහතාගේ මෑණියන් මෙන්ම ඔහු පසුපස සිටි දැවැන්ත සෙවණැල්ල වූ හෙලේනා විජයවර්ධන මැතිනියගේ වාසගම වූ වැවගේ යන නාමය අනුවය. එහෙත් බොහෝ කලක් යනතුරුම 'ලේක් හවුස් මන්දිරය' යන වදන වෙනුවට ජනතාව මේ අභිමානවත් ගොඩනැඟිල්ලට ගොඩ වූයේ 'දිනමිණ කන්තෝරුව' යන ගෞරව නාමයෙන් හඳුන්වා දෙමිනි. දිනමිණ කාර්යාලය ආරම්භයේ දී එය මෙරට කිසිවෙකු හෝ අපේක්ෂා නොකළ තරම් නූතන හා අංගසම්පූර්ණ පුවත්පත් කාර්යාලයක් ව තිබුණු බව ලේක් හවුස් මන්දිරයට ගෙවැදුණ දා ඒ වෙනුවෙන් නිකුත් කළ විශේෂ කලාපය කියැවීමේ දී පෙනී යයි.

එසේ අලුත් මන්දිරයකට ගොඩ වදින්නේ ද දිනමිණ සමාජ මෙහෙවරක් උදෙසා කැපවීමත් සමග එය ජනමතය ගොඩ නැඟීමෙහිලා බලවත් සාධකයක් වූ පසුවය. වඩාත්ම වැදගත් ඓතිහාසික අවස්ථාව නම් ඒ වන විට සැඟව තිබුණ මෙරට ජාතික කොඩිය 1915 වසරේ මාර්තු මස 2 වැනි දින දිනමිණ පුවත්පත සමඟ බෙදාහැරීමයි. එය පුවත්පත් ඉතිහාසයේ ද වාර්තාවක් ලෙස සලකනුයේ මුල්වරට වර්ණයෙන් බෙදාහැරුණු ඡායාරූපය වන්නේ එය බැවින්ය. ඉංග්‍රීසින් විසින් 1815 වසරේ මාර්තු මස 2 වැනි දින මහනුවර ඓතිහාසික මඟුල් මඩුවේදී පහත හෙළා එංගලන්තයට ගෙන ගිය ලංකාවේ ජාතික ධජය යළි සොයා ගැන්ම වැදගත් වනවා සේම එය යළි මෙරට වැසියන් අතට පත්කරලීම ඒ අවදිය හා සසඳද්දී මහත් විප්ලවීය සිදුවීමක් බැව් කිව යුතුය. එමෙන්ම නිදහස සඳහා වූ ජනමතය ගොඩනැඟීමේදී දිනමිණ දැක් වූ දායකත්වය විශාල එකකි. 1915 වසරේ සිංහල මුස්ලිම් කෝලාහලයේ දී දිනමිණ දැක්වූ නිර්භීතභාවය එහි ඉදිරි පැවැත්වීමෙහිලා මහත් ආලෝකයක් විය. ඒ අවදියේ බ්‍රිතාන්‍ය පාලනයේ අත්තනෝමතික තීරණ අභියෝගයට ලක් කරමින් දිනමිණ කළ මෙහෙය මෙරට ඉතිහාසයේම වැදගත් අවස්ථාවක් සේ ගිණිය හැකිය.

දිනමිණ මෙකී කාලය ඇතුළත කවර අතක පාලනයට ලක්වුව ද එහි සැබෑ පාඨක මෙහෙවර අවිවාදාත්මකව අගය කළ යුතුය. දිනමිණ නොකියවන්නෙමි'යි පස් පඩංගුවේ බැණ වදින ඇතැමුන් පවා කාටත් හොර රහසේ දිනමිණ සරණ යන අන්දම කාට කොයි හැටි වෙතත් දිනමිණටත් එහි වහල යට ඉන්නා සෙස්සන්ටත් රහසක් නොවේ. විෂයය ක්ෂේත්‍රයේ දී එය සෑම පසෙකම තොරතුරු එක ලෙස ගෙන එන්නේය. එයට ආවේණික සම්ප්‍රදායයන් බොහෝමයකි. පාඨකයන් ඇවිළවීම එහි සම්ප්‍රදාය නොවේ. අනිවාර්යයෙන්ම ප්‍රවෘත්තිය ප්‍රවෘත්තියක් සේ සලකනු විනා ප්‍රවෘත්තිය උළුප්පන සුලු එකක් නොවීම දිනමිණ සිරිතය. රැල්ලේ යනවාට වඩා වගකීමක් එයට නිතැතින් පැවරී ඇත. ත්‍රස්තවාදින්ට එරෙහිව අපේ විරෝදාර සන්නද්ධ හමුදා තුන් තිස් පැය පුරා නිදි වරා සටනේ යෙදෙද්දී දිනමිණට තරම් එම සේවාව වාර්තා කරන්නට කිසිවකුට හෝ අත්දැකීම් නොවීය. ගෙවුණු කාලය මුළුල්ලේ දිනමිණ පන්නරය ලැබ මෙරට පාඨක ලෝකයට පිවිසුණ පුවත්පත් කලාවේදීන් සංඛ්‍යාව ඉමහත්ය. එමෙන්ම මෙරට විවිධ ක්ෂේත්‍රයන්හි නම් දිනූ බොහොමයක් දෙනාගේ නම මුල්වරට ලෝකයා හමුවට ගෙන ගියේ දිනමිණය. එබැවින් එය මහත් ඵල ගෙන දෙන පුණ්‍ය කර්මයක් ද සිදු කර ගත්තේය.

ඒ ඉතිහාසය ලියූ දිනමිණ අද බ්‍රහස්පතින්දාට අවුරුදු එකසිය එකොළහ සපුරන්නේය. එය දිනමිණට වඩා අවුරුදු පනස් තුනක් බාල සරසවියට වැදගත් වනුයේ සරසවියේ ලොකු අය්යා දිනමිණ බැවිනි. එකසිය එකොළහ සාමාන්‍යයෙන් සලකනුයේ වැදගත් අංකයක් හැටියටය. දෙවිදුවගේ අංකය ලෙස සලකන එය තීරණාත්මක අංකයක් සේ බටහිර රටවල සැලකෙයි. ක්‍රිකට් ක්‍රීඩාවේ නම් නෙල්සන්ය. පිතිකරුගේ පෞද්ගලික ලකුණු සංඛ්‍යාව එකසිය එකොළහ වූ සැණින් ඇතැම් විනිසුරුවරුන් අමුතු ජාතියේ අංග චලන දක්වනු දක්නට ලැබේ. එය හොඳටත් නරකටත් දෙකට එකම වන අංකයක් සේ සලකන හින්දාය. දිනමිණට නම් එකසිය එකොළහ අලුත් යුගයකට මුල පිරීමකි. ඒ දිනමිණ හැමදාමත්, නොව පැරැණිය වන රමණීය ජාතියේ පුවත්පතක් ලෙස නම් දරන නිසාය.

අරුණ ගුණරත්න





# නිරෝගී, ප්‍රීතිමත් උත්සව සමයක්

සිද්ධාලේප

## ප්‍රතිශක්ති වර්ධක
## ආයුර්වේද නිෂ්පාදන තිළිණය




**මිල රු. 2500/- සහ රු. 5000/-**

**10 ට වැඩි ඇණවුම් සඳහා 10% ක වට්ටමක්**

වැඩි විස්තර සඳහා

077 6386807

077 0736910

# දිනමිණ අපි



ශ්‍රී ලංකාවේ දැනට පළ කෙරෙන පැරණිතම සිංහල පුවත්පත දිනමිණය. දිනමිණට අදට වසර 111කි. වසර 111ක් තිස්සේ ජනතාවගේ තොරතුරු පිපාසය සංසිඳුවන්නට කැප වූ දිනමිණ සැලකෙන්නේ මෙරට පත්තර ලොව මහ ගෙදර ලෙසිනි. දිනමිණ පණ ගැන්වෙන්නේ වෙහෙස නොබලා රාජකාරිය ඉටුකරන දිනමිණ කර්තෘ මණ්ඩලය නිසාය. අපක්ෂපාතී, නිවැරැදි, සමබර තොරතුරු ගෙනඑන දිනමිණ කර්තෘ මණ්ඩලය පත්තර ලෝකයේ විශාලතම පවුල යැයි කිවහොත් එහි වරදක් නැත.

දිනමිණ කර්තෘ මණ්ඩලය නෞකාවක් නම් එහි කප්පිත්තා ගාමිණී ජයලත් මහතාය. කර්තෘ මාණ්ඩලිකයන් ගාමිණී අයියා, ගාමිණී මහත්තයා ලෙසින් අමතන අපේ ප්‍රධාන කර්තෘතුමා කිසිවකුගේ සිත නොරිදවන අයකු ලෙසින් ප්‍රකටය. පත්තර රස්සාවට අමතරව නළුවකු ලෙසත් කටයුතු කරන ගාමිණී අයියා දිනමිණ ප්‍රධාන කර්තෘ ධුරය දරනුයේ දෙවැනි වතාවටය. සෑම දිනකම දිනමිණ පුවත්පතේ වැඩ අවසන් වන තුරු ගාමිණී අයියා සැනසෙන්නේ නැත.

දිනමිණේ දැනමුත්තා රංජන් අමරරත්නය. ද්විභාෂා උගතකු වන රංජන් අයියා මුදු මොලොක් කතා ඇත්තෙකි. බෙහෙවින් පොතපත කියවන ඇසූ පිරූ තැන් ඇති රංජන් අයියාගෙන් දිනමිණට ඉටුවන මෙහෙවර ඉමහත්ය. සමකර්තෘවරයකු ලෙස සේවය කරන රත්නසිරි පතිරණගෙන් දිනමිණට ඉටුවන්නේ සුවිශේෂී මෙහෙවරකි. විනෝදයට බර රත්නේ අයියා ලේඛනයෙන් මෙන්ම කවියෙන්ද දිනමිණට දායකත්වය දෙයි.

දිනමිණ ප්‍රවෘත්ති අංශයේ සමකර්තෘවරයකු වන නුවන් කොඩිකාර දක්ෂ තරුණ මාධ්‍යවේදියෙකි. ජනාධිපති සහ පාර්ලිමේන්තු මාධ්‍ය ආවරණවල වගකීමද ඔහු සතුය. ජ්‍යෙෂ්ඨ උසාවි වාර්තාකාරිනියක ලෙස කටයුතු කළ ශිරෝමි අබයසිංහ දිනමිණ ප්‍රවෘත්ති අංශයේ සමකර්තෘවරියක ලෙස සේවය කරන අතරම තමන්ට පවරා ඇති විෂයන්හි වගකීම් අකුරට ඉටුකරන්නීය. දිනමිණ ප්‍රවෘත්ති කර්තෘවරිය ලෙසින් සේවය කරන්නී සමන්මලී ප්‍රියශාන්තිය. උදේ බත උයා ගෙදරින් එන මලී රාත්‍රිය තෙක්ම සිය මෙහෙය ඉටුකරන්නීය. දිනමිණ රාත්‍රී ප්‍රවෘත්ති කර්තෘ ධුරය දරන චමීර ඇල්ලදෙණියද පාර්ලිමේන්තු මාධ්‍ය ආවරණ ඇතුළු ක්ෂේත්‍ර රැසක දස්කම් දැක්වූවෙකි. නියෝජ්‍ය ප්‍රවෘත්ති කර්තෘවරයකු ලෙස සේවය කරන ජයසිරි මුණසිංහ ආර්ථික අංශයේ ඕනෑම ප්‍රවෘත්තියක් හඹායෑමට හපනෙකි.

දිනමිණේ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදිනියක වන බුද්ධිකා ඉඹුලානට පැවරී ඇති වගකීම්ද සුළුපටු නොවේ. ඒ සියලු විෂයන් ආවරණය කරන අතරම විහිළුවෙන් තහළුවෙන් කල්ගෙවීමටද ඈ සමත්ය. ප්‍රධාන අධිකරණ වාර්තාකාරිනිය වන කුමුදු හෙට්ටිආරච්චි ද දිනමිණ පවුලේ පැරණි සාමාජිකාවකි. අධිකරණ සාවියේ ප්‍රවෘත්ති කුමුදු අතින් මගහැරෙන්නේම නැත. නෙල්කා මැදගෙදර, සිරංජනී කුමාරි සහ රෝෂන් තුෂාර අධිකරණ වාර්තාකරුවන් ලෙස කුමුදුට සහය වෙති. පාර්ලිමේන්තු වාර්තාකරණයෙහි අත්දැකීම් බහුල ස්වර්ණා විජේකෝන් හට සහය වන්නී සන්ධ්‍යා කරුණාරත්නය. නිහඬ චරිතයක් ලෙසින් ප්‍රකට සිතාරා සේනානි ඕනෑ දෙයක් ඕනෑ විදියට ලියන්නට හැකියාවක් ඇති මාධ්‍යවේදිනියක වන්නීය. පාස්කු කොමිසම, පාර්ලිමේන්තුව, අධිකරණය ආදී එකී මෙකී නොකී සියල්ලහේ වගකීම් දරන සුභාෂිනී සේනානායක සිටින තැනක පාළුවක් නම් නැත.


වෘත්තිය සමිති සහ වාමාංශික පක්ෂ සමඟ හිතවත්කම් ඇති අනුර ප්‍රේමලාල් මෙන්ම දේශපාලනය, ආර්ථිකය, විදේශ කටයුතු යනාදී විෂයන් ආවරණය කරන මහින්ද අලුත්ගෙදරත් දිනමිණට නැතිවම බැරි සාමාජිකයෝ වෙති. මහා සංඝරත්නය සමඟ මනා සබැඳියාවක් සහිත උපාලි කරුණාරත්න සිහිනෙකින්වත් කිසිවකුටත් වරදක් නොකරන්නෙකි. දිනමිණ වෙනුවෙන් ආරක්ෂක ප්‍රවෘත්ති වාර්තා කරන්නේ චන්ද්‍රිකා පෙරේරා සහ රක්ෂණ ශ්‍රියන්තය. ආරක්ෂක අංශවල සෑම අස්සක් මුල්ලක් නෑරම පීරා ප්‍රවෘත්ති සෙවීමට ඔවුන් දෙදෙනා කටයුතු කරයි. මානෙල් පුෂ්පකුමාරි පරිසර සහ වනජීවී අංශවල මාධ්‍ය ආවරණවලදී අපට සහය වන්නීය.

දිනමිණ ප්‍රවෘත්ති අංශයේ යොවුන් මාධ්‍යවේදිනියන් වන රිද්මි අමෝදා සහ චන්දිමා කරුණාරත්න ද පැවරෙන වගකීම් නිසි ලෙස ඉටුකරති. ශිවන්ති ප්‍රනාන්දු සහ නදී මාණික්කගේ දේශපාලන ප්‍රවෘත්ති වාර්තා කිරීමේ ශූරියෝ වෙති. බුද්ධි කරුණාරත්න දිනමිණේ විදෙස් පිටුව බාරව සිටින අතරම පුවත්පතට අවශ්‍ය අනෙකුත් විශේෂාංගද සපයයි. දිනමිණට අලුතෙන් සම්බන්ධවූ රුවන්ත නිතුල්ගස්පිටිය, නුවන් හෙට්ටිආරච්චි සහ පහන් විජේසේකර ප්‍රවෘත්ති අංශයට සුවිශේෂී දායකත්වයක් ලබාදෙන්නෝ වෙති.

උප කර්තෘ අංශය වනාහි ඕනෑම පුවත්පතක වැදගත්ම අංශය බව විවාදයක් නැත. සබ් එක පත්තරේ හබ් එක යැයි කියනුයේ ඒ නිසාය. දිනමිණ උප කර්තෘ අංශයේ ප්‍රධානියා වන්නේ ප්‍රධාන උප කර්තෘ සෙනෙහෙලතා මල්ගම්මනය. මල් අක්කා ලෙස කවුරුත් ආදරෙන් අමතන මල්ගම්මන පුවත්පත වෙනුවෙන් විශාල දායකත්වයක් දක්වයි. ප්‍රවෘත්ති අංශයෙන් යොමු කෙරෙන ප්‍රවෘත්ති තෝරා බේරා, කපා කොටා පිටුවලට යොමුකරන වගකීම ඇගෙන් අකුරටම ඉටුකෙරේ. නියෝජ්‍ය ප්‍රධාන උපකර්තෘවරයා වන සෙනරත් පුෂ්පානන්ද උපකර්තෘ අංශයේ ඕනෑම බරක් තනියම අදින්නට වුව සමතෙකි.

දිනමිණේ රාත්‍රී කර්තෘවරයා ලෙසද කටයුතු කරන ඉන්දික බණ්ඩාර දිනමිණේ සමකර්තෘවරයෙක් ද වේ. නියෝජ්‍ය රාත්‍රී කර්තෘවරුන් ලෙස සේවය කරන උපුල් බණ්ඩාර මෙන්ම නන්දික බැද්දේගමත් තමන්ගේ විෂය පථයන් හරිහැටි දැනගෙන රාජකාරිය ඉටුකරන්නට සමර්ථයෝ වෙති. සමන්මලී ජයතුංගගෙන් උපකර්තෘ රාජකාරියට අමතරව පරිවර්තන රාජකාරියක්ද ඕනෑ අවස්ථාවක ඉටුකරවා ගත හැක.

සන්නිවේදනය මනාව හදාරා සිටින චන්දන විජේකෝන් මෙන්ම විජිත එදිරිසිංහද උපකර්තෘ අංශයේ වගකීම් මනාව ඉටුකරන්නෝ වෙති. කිතුනු පිටුව සකසන සුමේධා නවරත්න උප කතු අංශයට ආලෝකයකි. වැඩි කතාබහක් නැතිව පැවරෙන රාජකාරිය ඉටුකරන නදීකා දිල්හානිත් චන්දන ජයවීරත් අපට මහත් සවියකි. උපකර්තෘ අංශයේ රසිකා හේමමාලි සහ චාමිකා මුණසිංහ පුවත්පතට නවකයන් වුවත් රාජකාරියට නවකයෝ නොවෙති. උපකර්තෘ අංශයේ සේවය කරන අයි. ඩී දැරණියගල අකුරු ඇමිණීමෙන් සහාය වේ. රට පුරා විසිරී සිටින පන්සියයකට වැඩි ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වගකීම පැවරී ඇත්තේ දිනමිණ ප්‍රාදේශීය ප්‍රවෘත්ති අංශයටය. සම්පත් දිප්පිටිගොඩ සහ දුමින්ද ගුරුගේ එම අංශයේ සමකර්තෘවරුන් ලෙස සේවය කරති. ප්‍රවෘත්තියකට පාඨක ඇස් බැඳගන්නා හෙඩිමක් දමන්නටත් ව්‍යාකරණානුකූලව ප්‍රවෘත්තියක් කපාකොටා සකස් කරන්නටත් ශූර සම්පත් අයියා මෙන්ම දිනමිණ ප්‍රවෘත්ති කර්තෘවරයා ලෙසින් කලක් කටයුතු කළ දුමින්ද අයියාද ප්‍රාදේශීය ප්‍රවෘත්ති අංශයේ නිසි බලධරයෝ වෙති.



දිනමිණේ ප්‍රාදේශීය කර්තෘවරයා ආසිරි මල්ලවාරච්චිය. දිනමිණට සැබෑ සම්පතක් වන ආසිරි ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සමඟ මනා සම්බන්ධතාවක් පවත්වාගෙන යමින් ප්‍රාදේශීය ප්‍රවෘත්ති අංශය හැඩ කරයි. ප්‍රාදේශීය ප්‍රවෘත්ති අංශයේ සෙසු සාමාජිකයන් වන නදීෂා චන්ද්‍රපාල, ඉන්දීවරී සෙනෙවිරත්න, නිමල් වීරක්කොඩි, ගයාන් සංජය, දිනූෂි මනතුංග හා උත්තරා ගුණරත්න මෙන්ම රසිකද මැසිවිල්ලකින් තොරව රාජකාරිය පමණක් නොව පැවරෙන ඕනෑම කටයුත්තක් මනාව කරන්නට සමර්ථය.

දිනමිණ පුවත්පතේ විශේෂාංග කර්තෘවරුන් ලෙස සේවය කරන්නේ චතුර ගීතනාත් බණ්ඩාර සහ රසිකා රණවීරය. දිනමිණට නව මුහුණුවරක් එක්කරමින් සතියේ දින හයටම විශේෂ අතිරේක හඳුන්වාදීමේ කාර්යය ඉටුකෙරුණේ චතුර අතිනි. දිනමිණේ පැරණි සාමාජිකාවක වන රසිකා රණවීරද විශේෂාංග අංශයට සවියක් වී සිටින්නීය. නියෝජ්‍ය විශේෂාංග කතුවරුන් වන ඉරෝෂිණී දීපිකා සහ දුමින්ද අලුත්ගෙදර දිනමිණේ විශේෂාංග අංශය ශක්තිමත් කිරීමට දායක වෙති. විවිධ විශේෂාංග ලිවීමේ රුසියන් අතර ශ්‍යාමා සමරසිංහ, කාංචනා අමිලානි, අනුසාර මාහිංගොඩ, උදිත ගුණවර්ධන, දර්ශ කපුගේ, චතුමි පිටිපන, චින්තා රණසිංහ, දිල්රු ජයසේකර, රජිත බස්නායක, නුවන් මහේෂ් ජයවික්‍රම කැපී පෙනෙති. විශේෂාංග අංශයේ සේවය කරන බන්ධුල ගුණරත්න සහ මහින්ද ආරියවංශ ක්ෂේත්‍රයේ ප්‍රවීණයෝ වෙති. දිනමිණේ ව්‍යාපාරික කර්තෘවරිය ලෙස කටයුතු කරන්නේ බුද්ධිකා බ්‍රාහ්මණගේය.

දිනමිණ පිටු සැකසුම් අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන්නේ ගන්දික ධර්මබන්ධුය.

දිනමිණේ අලංකාර පිටු සැකසුම් සඳහා ගන්දික සමඟ ගීතික නාවන්න, මලින්ද ප්‍රේමරත්න, අමිල වීරසූරිය, දීපාල් සංජීව, දමිත් දිල්ෂාන්, ඉන්දික රාමනායක, අංජුල ජයලත්, පසිඳු රැටියල, එරන්ද සිරිමාන්න, කමල් පෙරේරා එකාවන්ව කටයුතු කරති. දිනමිණ සෝදුපත් කියැවීමේ දෙපාර්තමේන්තුව අංශ ප්‍රධාන රෝහිත ඇතුළු නුවන්, ගයාන්, මංජුල, අනුරාධ, ශ්‍රී කාන්ත සහ සෝමසිරි යන අයගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වද්දී දිනමිණ අකුරු ඇමිණුම් අංශය ක්‍රියාත්මක වන්නේ ප්‍රසන්න අල්විස්ගේ අධීක්ෂණය යටතේ ජගත්, ප්‍රසාද්, අනූෂා, රජිත, රත්නසිරි සහ අජන්තගේ සහයෝගයෙනි. දිනමිණේ සියලු ලිපි කියවා බලමින් භාෂාව නිවැරැදි කිරීමට දිවාරාත්‍රී වෙහෙසෙන ජයත් පියදසුන් අපට නැතිවම බැරි චරිතයකි. දිනමිණ ලිපිකරු අංශය නියෝජනය වන්නේ සීතා, ප්‍රසාදි, තුෂාර, රත්නසිරිගෙනි. චන්දන, ධනසිරි, රවිඳු සහ සේසිරි අපට නොයෙක් කටයුතුවලදී සහය වන්නෝ වෙති.

දීර්ඝ කාලයක් දිනමිණේ සේවය කරමින් සිට මෑතකදී විශ්‍රාම ගිය දිනමිණ නියෝජ්‍ය ප්‍රවෘත්ති කර්තෘවරයා වූ මහින්ද කුලතුංග ගැනත් යමක් කිවයුතුමය. දිනමිණේ සෑම උත්සව අවස්ථාවකදිම නිවේදන කටයුතුවලින් සහය වූ මහින්ද අයියා අපට සිටි ප්‍රවීණතම ආරක්ෂක වාර්තාකරුවෙකි. මහින්ද අයියා සිටින තැන පාළුවක් නම් නැත. එසේම වසර 111ක් සපුරන දිනමිණේ මෙතෙක් කල් සේවය කළ එහෙත් අද අප සමඟ නැති සියලුදෙනාටද අපගේ ස්තුතිය පිරිනැමිය යුතුමය. දිනමිණෙන් බිහිව පසුව අනෙක් මාධ්‍ය ආයතන සමඟ එක්වූ පිරිසද අපට අමතක නැත.

දිනමිණ පවුල මෙසේ වෙතත් ලේක්හවුස් ආයතනයේ ප්‍රවාහන, මුද්‍රණ, ගිණුම්, බෙදාහැරීම්, මෙහෙයුම්, පරිපාලන යනාදි වශයෙන් සෑම දෙපාර්තමේන්තුවකම සහයෝගය නැත්නම් දිනමිණ ඔබ අතට පත්කිරීම අසීරු කාරණයක් බව අමුතුවෙන් කිව යුතු නැත. දිනමිණේ ඇත්තන් ගැන ඔබට කී මම ධනුෂ්කය.



දොළොස්මහේ පහන

# තරුණ කුසලතා අගයන දිනමිණ භූමිකාව

දිනමිණ ජාතික පුවත්පතෙහි වයස අවුරුදු එකසිය එකොළහකි. (111)ක්‍රිකට් ක්‍රීඩාවේ දී නම් 111 අසුබ සංඛ්‍යාවකි.එහෙත් ද්විත්ව ත්‍රිත්ව නෙල්සන්ලා පසුකරමින් වාර්තා පිහිටුවා ඇති ක්‍රිකට් ක්‍රීඩකයෝ වෙත්.ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩාවේ බ්‍රයන් ලාරා නෙල්සන්ලා ත්‍රිත්වයක් පසුකරමින් ලෝක වාර්තාවකට හිමිකම් පානා ක්‍රීඩකයෙකි.එනයින් සලකන කල අපට හැඟෙන්නේ 111 යනු ජයග්‍රාහී දීර්ඝ ගමනක ආරම්භයක් ලෙසයි.දිනමිණ ඒ ආරම්භය සටහන් කරයි.දශක එකොළහක් යනු දීර්ඝ කාලයකි. මේ සා දිගු කාලයක් පාඨක විශ්වාසය දිනා ගනිමින් ජාතික පුවත්පතක වගකීම, කාර්යභාරය හා යුතුකම හඳුනාගෙන පවතින්නට හැකිවීම අභියෝගයකි. විශේෂයෙන්ම තරගකාරී මුද්‍රිත ජනමාධ්‍ය ප්‍රකාශන රැසක් මධ්‍යයේ දිනමිණ අභියෝග ජයගනිමින් ජයග්‍රාහී මාවතක ගමන් කරනු පෙනේ.

පුවත්පත් කියවන්නට පුරුදු වූ බාල කාලයේ සිට දිනමිණ ආසාවෙන් කියවන්නට පුරුදු වී සිටි නමුත් කිසිම දිනක දිනමිණ හා සම්බන්ධ වී එහි සම්පත්දායකයකු වන්නට වාසනාවක් වේ යයි කිසි දින නොසිතුවෙමි. එහෙත් 1966 දෙසැම්බර් 05 දා එනම් දිනමිණට වයස අවුරුදු හැටහයක් වන මාසයේ දිනමිණ නිර්මාණ පිටුව ඔස්සේ කවියකු ලෙස බෞතීස්ම ලදිමි.පුවත්පතක පළ වූ මගේ ප්‍රථම කාව්‍ය නිර්මාණය දිනමිණෙහි පළවන්නේ හද පිපි මල මැයෙනි.වයස අවුරුදු දහ අටක යෞවනයකු ලෙස දිනමිණ කවිපිටුව සරසමින් පුවත්පත් කවිපිටුවකින් පාඨකයන් හමුවට යන්නේ සරසවියේ පළමු වසර සිසුවකු ලෙසය. ගංගොඩවිල ඒ.පී.ජී. බුද්ධදාස ලෙසින් එදා දිනමිණෙහි පළ වූ කාව්‍ය නිර්මාණය දශක පහකටත් වඩා වැඩි දිගු කාලයක කාව්‍යකරණයේ මා රඳවා තැබීමෙහි ගෞරවය දිනමිණට පුද කරමි.1966 දී ඇරඹි මගේ කවිය 1971 සිට අද දක්වා කාව්‍ය සංග්‍රහ නවයක හිමිකරුවකු බවට පත් කොට තිබේ.ඒ කවි අස්වැන්නට දිය ඉස පොහොර දැමූ බිමක් ලෙස දිනමිණ සිහිකිරීමට පසුබට නොවෙමි. දිනමිණ මුල් පුටුවෙහි අසුන් ගත් ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් විසින් තරුණ කුසලතා හඳුනාගනිමින් නිර්මාණකරණයෙහි නිම් වළලු පුළුල් කර ගැනීමට ඔවුනට ලබා දුන් අවස්ථා පිළිබඳ සිහිකිරීම වටී.

හැත්තෑව දශකයේ මෙරට සාහිත්‍යය, සිනමා, නාට්‍ය කලා ක්ෂේත්‍ර තුළ විශේෂයෙන් 71 තරුණ පිබිදීමෙන් පසුව විද්‍යමාන වූ තරුණ චින්තනය රැගත් රැඩිකල් නිර්මාණකරුවන්ට, ඔවුන්ගේ නිර්මාණ සඳහා නිසි ප්‍රචාරය හා විචාරයට අවකාශ සලසමින් තරුණ කුසලතා හඳුනාගෙන දැක් වූ දායකත්වයට සීමාවක් නොවිණ. 73 දී පමණ රසවාහිනියේ සිට දිනමිණ මුල් පුටුවට පැමිණි පෙරමුණේ තිලක වැනි වැඩිහිටියකුගේ නිර්ලෝභී අතහිත දීම් අමතක කළ නොහේ. ඔහු දිනමිණ කර්තෘ ලෙස ලේක් හවුසියට පැමිණ දුරකතනයෙන් මා ඇමතූ අයුරු මතකයේ රැඳී ඇත. 'බුද්ධි මම පෙරමුණේ, දැන් දිනමිණේ '.තරුණයන්ගේ නිර්මාණ සඳහා ම වෙන් වූ තරුණ වරුණ නිර්මණ සංග්‍රහය සඳහා කර්තෘ වාක්‍ය පිටුවෙහි ඔහු විසින් ඉඩ ලබා දුන් අයුරු මතකය. පළමු තරුණ වරුණ තුළ මොනිකා රුවන්පතිරන ප්‍රමුඛ අපගේ නිර්මාණ සඳහා ඉඩකඩ ලබා දීමට ඔහු නිර්ලෝභී වීය.දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා පිළිබඳ තරුණ ඇසින් බැලූ විශේෂාංගයකට ඔහු විසින් නැවතත් කර්තෘ වාක්‍ය පිටුවෙහි ඉඩ ලබා දෙන ලදි. සම්පත් දායකයන් ලෙස ඇරැයුම් කරන ලද්දේ මොනිකා රුවන් පතිරණ, කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක රෝහණ ලක්ෂ්මන් පියදාස, බුද්ධදස ගලප්පත්ති වැනි තරුණ නියෝජනයකට ය.දිනමිණ සම්ප්‍රදාය පසුකාලීන කර්තෘවරුන් විසින් ද අඛණ්ඩව පවත්වා ගේන ආ අතර, බන්දුල පද්මකුමාර වැනි සභාපතිවරයකුගේ මග පෙන්වීම යටතේ තරුණ නිර්මාණකරුවන් ඇගයීමේ ක්‍රියාවලිය නොනැවතී ඉදිරියටම පැමිණි බව පෙනේ. බද්දර මල්ල, ලිවිසැරිය, වසත් සුළඟ හා තවත් විශේෂාංග අතිරේක අතර නිර්මාණශීලී තරුණ නියෝජනය ප්‍රභාවත් වූ බව දකිමි.

1966 දී තරුණයකු ලෙස දිනමිණෙහි දුටු කවිය විසින් ලද ප්‍රබෝධනය ඔස්සේ කවිය මතු නොව, කෙටිකතාව, තීරු ලිපි හා විශේෂාංග රචනය වැනි ජන මාධ්‍යයේ විවිධ ඉසව් තුළ සක්‍රීයව රැඳී සිටිමි. අප මෙන්ම දිනමිණෙහි ආලෝකය ලබමින් බැබළෙන නව පරපුරේ තාරකා රැසක් දකිමි.

**බුද්ධදාස ගලප්පත්ති**




## ඉපැරැණි මතක















ALUMEX®
Ultimate in Aluminium Profiles

# Panel Door System



**Main Features:**

- Structurally strong, secure and economical
- Can build large sizes – strong outer frame and internal leaf/panel
- Durable and elegant – very strong, long lasting and better looking than conventional doors
- A range of options to choose from – vertical / horizontal panelling and different designs
- Recommended for front doors as well
- Leaf hinges with Allen Bolt to easily adjust door height

LuminConcepts

LUMIN INVITE LIGHT | ALUMEX® | The World Of Hayleys

No:307,Nawala Road,Nawala. Tel: 0112 806 091 | No:268/A,Mahaiyawa, Katugasthota, Kandy. Tel: 0812 267 870 |
No:9,A9 Road, Ariyalai,Jaffna. Tel: 0769 078 703 | No:126,Matara Road, Galle. Tel: 0912 227 850 |
No:154, Messenger Street, Colombo 12. Tel: 0114 343 597 | No: 55/2,Makola North, Makola. Tel: 0112 911 268 |
No. 204A, Veyangoda Road, Minuwangoda. Tel: 0761 382 936 / 4

www.lumin.lk

# සාහිත්‍ය සේවි සංස්කෘතික සත්ත්වයා

පත්තරයක් පළ වෙනවා කියන්නෙ විශ්වවිද්‍යාලයක් ඇරඹුණා වාගෙයි කියලා එදා කීවේ අපේ කළුකොඳයාවේ පඥාශේඛර නායක හාමුදුරුවෝ. එදාට වඩා අද තත්ත්වය වෙනස්. ඒ කොහොම වුණත් පත්තරයක් පටන් ගන්නවා කියන්නෙම ව්‍යාපාරික වැඩක්. එහෙම වුණාම එහි මූලිකම පරමාර්ථය ලාභ ලැබීමයි. ඒත් එක්කම පත්තරයකින් ඉටුවන සමාජ වගකීම් රාශියකුත් තියෙනවා. ඒ වගකීම ඇත්තටම හරි ගැඹුරුයි. ගැඹුරු වූ සමාජ වටිනාකමක් එම වටිනාකමේ පූර්ව ගුණයෙන්ම ඉටුකරන්නට නම් ඒ පත්තරේට ආර්ථිකමය වටිනාකමක් තියෙන්නට ඕනෑ. ඒ කියන්නේ ඉල්ලුමක්. එහෙම නොවන්නට පුවත්පතකට වෙළෙඳපොළ තුළ රැඳෙන්නට තමන්ගේ අවශ්‍ය "වෙළෙඳපළ අගය" නැති කර ගන්නවා. (MarketShair) මේ නිසා අද ලෝකයේ පාඨකයා වගේම වෙළෙඳ දැන්වීම් ලබා දෙන ග්‍රාහකයොත් මාධ්‍යකරුවාගේ පාරිභෝගිකයෝ වෙනවා. ඒ විදියට බලද්දි අද මාධ්‍යකරුවා මොනවාද කරන්නේ, 'පාරිභෝගික අවශ්‍යතා' (Consumer Right) සපුරමින් ඉදීමයි.

මේ කටයුත්ත ඉතා බැරෑරුම්ව කරන්නට ඕනෑ දෙයක්. ඒ කියන්නෙ එය සිදුවිය යුත්තේ සවිඥානිකවයි. එහෙම නොවුණොත් වෙන්නෙ පිටු පුරා පාට පාට වර්ණ තවරපු පිටු සැකසුම් ශිල්පියකුගේ (Layout) සිත් වසග කිරීමක් විතරයි. අපිට එය කියන්නට වෙන්නෙ ග්‍රාහකයා නිර්වින්දනය කරනවා කියලයි. වර්තමානයේ බොහෝ පුවත්පත් මගින් සිදුකරන්නේ අද කරමින් සිටින්නේ ග්‍රාහකයා නිර්වින්දනය කරමින් පුවත්පතේ 'මානව හිතවාදී ජනමාධ්‍යකරුවා' මරා දැමීමයි. මේ බව අපි දකින්නේ අද විය හැකියි. ඒත් එදා 1972 දී මාර්ෂල් මැක්ලුමන් නම් ජනමාධ්‍ය විශේෂඥයා අපට කියා දෙන්නේ "Mass Media Consumption as a Functional Alternative" පොතින්.

මේ නිසා තමයි සමාජය ගැන තරගකාරීත්වය ගැන හා ග්‍රාහකයා ගැන අවබෝධයක් ඇති මාධ්‍යකරුවා සන්ත්‍රාසයකින් තොරව තමන්ගේ ග්‍රාහකයාට ආරක්ෂාව දෙන්නෙ. ඔහු එය කරන්නෙ සිය නිෂ්පාදන භාණ්ඩය වූ පුවත්පත ඔස්සේ ඉතා ගැඹුරු සමාජ වගකීමක් මානව හිතවාදිත්වයෙන් යුතුව දැරීමෙනුයි.

ඒ ගැන කියද්දි මාධ්‍යයට අමතක නොවන වාර්තාවක් තමයි යුනෙස්කෝව ගරු කරන "මැකී බ්‍රයිට් වාර්තාව" එයට අනුව ජනමාධ්‍යකරුවා කුමන සැහැල්ලු කාරණයකදී වුණත්, තමන්ගේ ග්‍රාහකයාට ගුරුවරයකු වගේම අර්ථපතියකුගේ දැනුම් සම්භාරයක් ලබාදෙන්නට උත්සාහ දරන්නෙක්. (Many voices one world - 1982) මේ නිසාම පැරණි දේවධර්මවාදී මහා බ්‍රිතාන්‍ය ජනමාධ්‍යකරුවා 'සිව්වෙනි ආණ්ඩුව' ලෙසින් නම් කර තිබුණා.

පුවත්පතක නිර්මාණාත්මක එළැඹුම අපි දකින්නේ කොහොමද? එය මතුව එන්නෙ ඔවුන්ගේ උපායමාර්ගික සැලසුම්කරණය මගින්. කලාත්මක නිර්මාණයන්ට ඉඩදීමෙන් ඔහු නිර්මාණකරුවා සහ ග්‍රාහකයා අතර පාලමක් බවට පත් වෙනවා. මෙය එක් අතකින් ජනමාධ්‍යකරුවාගේ ප්‍රබුද්ධත්වය වගේම ගවේෂණශීලත්වයක් පෙන්වන්නක්. එයම ඔහු සිය සමාජය ගැන දක්වන සමාජ සන්නිදර්ශනාත්මක පරිකල්පනාවේෂය හා කැපවීම පෙන්නුම් කරනවා. මේ තත්ත්වය දියෙන් කිරි වෙන්කර ගන්නා හංසයකු සේ පෙරා ගන්නට ග්‍රාහකයා නැත්නම් පාඨකයා දන්නවා. ඔහු එය දැන ගත් විට එම පුවත්පතේ යාවජීව ගනුදෙනුකරුවකු හා පාරිභෝගිකයකු බවට පත් වෙනවා.

මෙය සිදුකරන්නේ කෙසේද? පුවත්පතක ප්‍රවෘත්ති, දැනුම සපයන විවිධ විෂයන් මත රචනාවක ලිපි, විදේශීය සබඳතා, වෙළෙඳපොළ දැනුම හා ග්‍රාහකයාට විනෝදය හා දැනුම සපයන නිර්මාණාත්මක සන්නිවේදනය මගින්. මෙහිදී පුවත්පතේ සැලසුම්කරණය ඉතා වැදගත්ය. එහෙත් සම්මත සැලසුම්කරණය ඉක්මවා ගිය මානව සැලසුම්කරණයක් ඒ තුළට කාන්දු කළ යුතුය. එනම් ග්‍රාහකයා කියවා ඔහුගේ පරිකල්පනය සමඟ ගනුදෙනුවක් ඇති කළ හැකි සැලසුම්කරණයකට පුවත්පත සකස් කළ යුතුය. මේ අනුව පුවත්පතක එම පාලම ඉදිවෙන්නෙ විශේෂාංග කර්තෘ මගිනි. ඒ අනුව ක්‍රිකට් ක්‍රීඩාවේදී එකසිය එකොළහක් පසු කරමින් තවත් නොදැවී ඉන්නෙ එහි තිබූ ඕජෝ ගුණය නිසාවෙන් නොවේද?

අප සලකා බලන්නේ එකුන් වැඩි දශක ශතකයක මතක සැමරුම් සමඟ "දිනමිණ" පුවත්පත ශ්‍රී ලාංකේය සාහිත්‍ය චාරිකාවේදී දැක් වූ සුපසන් වූ සංග්‍රහශීලීත්වයයි. මේ කරුණේදී ඉතා වැදගත් වන්නේ ජනමාධ්‍යකරුවාගේ උපායශීලීත්වය මත ඉදිවෙන සාහිත්‍යාත්මක සංවාද හා සංරචන මණ්ඩපයයි. එදා මෙදාතුර කාලය තුළදී 'දිනමිණ' විසින් ඉටුකළ සාහිත්‍ය සේවාව ඒ මගින් බිහි වූ නිර්මාණකරුවන්ගේ පැටිකිරිවලින් වැහෙන රස බස්වලින් පෙනේ. ජී. බී. සේනානායකයන් සේම වෛද්‍ය ආචාර්ය ගුණදාස අමරසේකරයන් ද මේ ලෙසට සිංහල සාහිත්‍ය වංශ කතාවට හඳුන්වා දුන්නේ "දිනමිණ"යි. එහිදී වැදගත් වන්නේ එදා එවන් උරුමකම් හා හැකියාවන් දැන ගන්නා ඉවෙන් යුතු නිර්මාණශීලී හා ආධානග්‍රාහයෙන් තොරව කටයුතු කළ සංස්කාරකවරුන් "දිනමිණේ" සිටීමයි. මේ දැවැන්ත නිර්මාණකරුවන් දෙදෙනා පිටුපසම එදා මාර්ටින් වික්‍රමසිංහ සිටියේ "දිනමිණ" කර්තෘවරයකු ලෙසිනි. එපමණක් නොව එදා බිහිවූ බොහෝ නිර්මාණකරුවන් සේම පුවත්පත් කතුවරුන් සේම ලේඛකයින්ද දොරට වැඩියේ 'දිනමිණ' නිර්මාණශීලි වේදිකාව ඔස්සේය. මගේ අත්දැකීම් 'දිනමිණ' සමඟ සම්මුඛ වන්නේ 1973 න් පසුවය. එදවස 'දිනමිණ', 'තරුණ අරුණ' පිටුව මෙරට සාහිත්‍ය ලෝකයේ වර්තමානයේ දී නම් දරන බොහෝ දෙනෙකුගේ තිඹිරිගෙය වූයේය. මට මතක ලෙසින්, සුමිත්‍රා රාහුබද්ධ, ලක්ෂ්මි බෝඹුවල, බුද්ධදාස ගලප්පත්ති, ප්‍රියානන්ද විජේසුන්දර, කපිල කුමාර කාලිංග වැනි බොහෝදෙනෙකු 'දිනමිණ' සාහිත්‍ය සේවනයේ පහස ලැබුවන්ය.




**අප සලකා බලන්නේ එකුන් වැඩි දශක ශතකයක මතක සැමරුම් සමඟ "දිනමිණ" පුවත්පත ශ්‍රී ලාංකේය සාහිත්‍ය චාරිකාවේදී දැක් වූ සුපසන් වූ සංග්‍රහශීලීත්වයයි. මේ කරුණේදී ඉතා වැදගත් වන්නේ ජනමාධ්‍යකරුවාගේ උපායශීලීත්වය මත ඉදිවෙන සාහිත්‍යාත්මක සංවාද හා සංරචන මණ්ඩපයයි.**

මගේ පැමිණීම වන සමයේ එකල යෞවනයන් අතර උන්මාදයක් බවට පත් වූ "නව යුගයේ" පළ වූ "රෝසමල" නවකතාව ලියූ රාජා ටී බස්නායකයන් 'දිනමිණ' 'තරුණ අරුණ' විශේෂාංග කතුවරයා විය. දයාසේන ගුණසිංහ, එඩ්මන්ඩ් රණසිංහ හා එඩ්වින් ආරියදාසයන් තවත් පැත්තක සිට අපගේ ලියමන් ඔපවත් කළා මට මතකය.

ඔවුන් එදා අප වෙත දැක්වූ මඟපෙන්වීම සේම නිර්මාණ දායකත්වය ආධුනිකයන් වූ අපගේ නිර්මාණාවේෂයන් යන මඟකට රැගෙන ඒමට පෙර මග දැල්වුණු දැවැන්ත පහන් ටැඹවල්ය. එයින් දිනමිණ එදා සිටම පාඨක රුචිය හා ඔවුන්ගේ අවශ්‍යතා දැන සිටි බව පෙනේ. වර්තමානයේදී මා නිර්මාණකරුවකු වශයෙන් කිසියම් හෝ සිහිවටනයක් මෙරට පාඨක සහෘදයන්ගේ සිත්හි රඳවා ඇත්නම් එහිදී මට යෝධ සවියක් වූ නිර්මාණ වේදිකා කිහිපයෙන් මුල්තැන් ගන්නා තිඹිරිගෙවලින් එකක් වන්නේ අපේ "දිනමිණ"යි. මගේ කාව්‍ය හා කෙටි කතා "දිනමිණ" සාහිත්‍ය සේවනයේ නොනිම්ව ලද පහසේ සුභානුස්මරණීය නවාතැන් පළකි.

දිනමිණ මෙසා ලෙසින් සාහිත්‍යයට නම් ගත් සංස්කෘතික මිනිසුන් දායක කළේ කෙසේද? කිසිදු අත්තුක්කංසනයකින් තොරව එදා සිට අද දක්වා ඔවුන් රැගෙන එන මාධ්‍ය සදාචාරය නිසා එය සිදුනොවුණා යැයි අපි කෙසේ කියමුද? අද මා මේ මොහොතේ 'දිනමිණ' සේම එදා සිටි මෙන්ම මෑතකදී පවා මා වෙත දයාලු සහෝදරත්වයක් දනවන විශේෂාංග කතුවරු හා ප්‍රධාන කතුවරුන් අප සිහිපත් කරන්නේ ඒ නිසා නොවන්නේද? එහිදී අප ලැබූ භාග්‍යය වූයේ සාහිත්‍ය දන්නා නිර්මාණශීලී මාධ්‍යකරුවන් දිනමිණේ සිටීමයි. අප එදා අඟහරුවාදා දිනමිණ ගන්නේ ජයවිලාල් මහතාගේ චිත්‍රපට විචාරය කියවා සිනමාව කියවීමටය. එසේම සඳුදාට දිනමිණ ගන්නේ 'තරුණ අරුණ' සාහිත්‍ය විශේෂාංගය නිසාවෙනි. අද වුවද අතිරේකයක් හෝ කිසියම් පුවත්පතක් සමඟ සති අන්තයේ හෝ නිකුත් වෙන පුවත්පතක අතිරේකය පාඨකයා මුලින්ම කියවන්නේ එහි ඇති නිර්මාණශීලීත්වය, රසාලිප්තබව හෝ විනෝදාස්වාදී දැනුම් සම්භාරය නිසාවෙනි. ඒවා දෘශ්‍ය හා ශ්‍රව්‍ය විය හැකිය. ඒ අනුව "දිනමිණ" සාහිත්‍යය සමඟ එදා සිට අදටත් බෙදා දෙන්නෙ දැනුමයි. ඒ මගින් ඔවුන් හඳුන්වා දෙන්නෙ නිර්මාණකරුවන්ය.

"දිනමිණ සාහිත්‍යය සංරචනය නිසා කොතෙක්නම් ශිල්පීන් තමන්ගේ නාමය ග්‍රාහක සිත් තුළ තැන්පත් කරවා ඇති ද? ඔවුන්ට එහිදී ශාස්ත්‍රීය මෙන්ම වාණිජ වටිනාකමක් ද පාඨකයාට ලබාදී ඇත. ඒ අනුව "දිනමිණ" අලෙවිකරණයට අනුව යහපත් ව්‍යාපාරිකයෙකි. ව්‍යවසායකයෙකි. යහපත් නිෂ්පාදකයා තමන්ගේ භාණ්ඩයට සේම පාරිභෝගිකයාටද අගයක් දෙයි. සුරක්ෂිතභාවයක් සපයයි. රැවටීම හසු නොකරවයි. එසේම සංවර්ධනය කරවයි. ඒ අනුව මාධ්‍යකරුවා වූ 'දිනමිණ' නම් නිෂ්පාදකයා සිය පාරිභෝගිකයා වූ ග්‍රාහකයාට, පාඨකයාට ප්‍රචාරණයක්, අත්දැකීමක් මෙන්ම වටිනාකමක් ද දී ඇත. ඒ අනුව ජනසන්නිවේදන විෂය මාලාවට අනුව පුවත්පත්කරුවා සතුවිය යුතු ප්‍රබුද්ධත්වය හා ගවේෂණශීලිත්වය යනු ඒ මගින් ප්‍රකට කරවා ඇතැයි අපට නොකිව හැක්කේද? එසේම කලෙක එහි සිටි විශේෂාංග කතුවරයාම අද "දිනමිණ" මුල් පුටුවේ සිටීමත් බොහෝ ආධුනිකයන්ට පෙරට ඒමට වැඩි වැඩියෙන් අවස්ථාව ලැඟබෙන්නට හේතුවක් වන්නේ වත්මන් විගශ්ෂාංග කතුවරයා වර්තමානයේ නිර්මාණාත්මක ලෝකයේ සුළං හඹන අත ඉතා හොඳින් දන්නා නිසයි. පුවත්පතකට අවශ්‍ය වන්නේ එයයි. මානවීයත්වය සහ ප්‍රබුද්ධත්වයයි. විෂය පිළිබඳ දැනීම හා ගවේෂණයයි. ඒ අනුව ඔවුන්ට සිය පාඨකයාගේ "තිනෙත" බවට පත්විය හැකිය. එදා පුවත්පත ජනප්‍රිය වී මෙතෙක් දුරට ආයේත් තවදුරටත් ඔවුන් සමඟ ඔවුන්ගෙන් මතුවූවන් සිටින්නේත් මාධ්‍යකරුවා දනවන හෘදයාංගමභාවය මතයි. එය එසේ නොවන්නට ග්‍රාහකයා ඔවුන්ට විඳීමට නොලැබෙයි. ග්‍රාහකයාගේ ඉව හා වින්දනය විඳීමට හැකිතාක් සාහිත්‍යය සහ විමංසනය විචාරශීලීව පුවත්පත පෙරට ගෙන යනු ඇත.

පුවත්පත්කරුවාගේ මානව සමාජ දෘෂ්ටිය පුළුල් වූ තරමට ඔහු වටා ග්‍රාහකයා ළං වෙනු ඇත. ඒ තරමටම සාහිත්‍ය නිර්මාණකරුවන් බිහි වෙයි. ඒ මඟින් පෝෂණය වෙනු ලබන්නේ සමාජයයි. එම සමාජය සබුද්ධික කරවන තරමින් රටකට 'සංස්කෘතික මිනිසුන්' ඇති වෙයි. වර්තමානයේ දී නැත්තේ ද මෙයයි. මේ නිසා අද බොහෝ සමාජකාරණාවලදී තිබිය යුතු සම්භාවනාව හා සම්භාව්‍යයව දුරස් වී ඇත. පසුගිය කාලවලදී මරණයේ තිබූ සම්භාව්‍ය රූපණය ඉරා දැමූ සමාජයක ඇති වූ අවකාශය පිරවිය හැක්කේ සාහිත්‍යකරුවාටය. එබැවින් සාහිත්‍යය වෙනුවෙන් යොමු වීම හා කියවීම පුවත්පතක අනාගත ආයෝජනයකි. එම ආයෝජනය ඉතා ගැඹුරින් හා සමාජ ශ්‍රද්ධාශීලී කල්පනයෙන් බලන්නේ නම් මේ සමාජය මෙයිට වඩා යහපත් වෙනු ඇත. මිනිසුන්ගේ මිනිස් සුවඳ වහනය කරවනු ඇත.

එම සංස්කෘතික සත්ත්වයා මැවීමට වඩාත් හැකි වෙන්නෙ මාධ්‍යයටයි. එබැවින් වඩාත් සම්පත් ඇති පුළුල්ව පැතිරුණු ව්‍යාපාරික භූගෝලයක් ඇති "දිනමිණ"ට එම සංස්කෘතික සත්ත්වයා මතුකරවා ගත හැකිය. ඒ සඳහා මෙතෙක් නොනැසී පවත්වාගෙන එන සාහිත්‍ය විශේෂාංගකරණය ගැඹුරින් දියත් කළ හැකිය.

සංස්කෘතිය හා සන්නිවේදනය ගැන සාකච්ඡා කරන ආචාර්යවරුන් දෙදෙනෙකු වන ටී. ක්ලේවැන්ජර් හා ජේ. මැතිව්ස්ගේ කියමනක් මෙහිදී වැදගත් වෙනවා. ඔවුන් කියන්නේ "කිසියම් ශිෂ්ටාචාරයක සමස්ත සාරධර්ම විශ්වාස හා භාවිතයන් රැඳී සිටින්නේ සංස්කෘතිය මත" බවයි. එසේ නම් ජාතික පුවත්පතක් වූ "දිනමිණ"ට සමාජයීය මෙන්ම නිල අයිතියක් ද පැවරෙන්නේ සදාචාරාත්මක සංස්කෘතික මිනිසකු බිහිකරවීමටයි. එසේම අප මුලින් කියූ යුනෙස්කෝ මැක් බ්‍රයිඩ් වාර්තාව කියන්නෙත් සන්නිවේදනයේ කාර්ය භාරය සැලකිය යුත්තේ සංස්කෘතික ප්‍රවාහයේ මුඛ්‍ය වාහකයා ලෙසින් බවයි. එසේ නම් සන්නිවේදන ක්ෂේත්‍රයේ මාධ්‍ය යනු සංස්කෘතික මෙවලමකි. එසේ නම් "දිනමිණ"ට නව චින්තනයක් ඔස්සේ ගතව ගිය එතැන් වැඩි දශක ශතක සංවත්සරයේදී නැවුම් සාහිත්‍ය සංසේවනයක යෙදිය හැකිය. එවිට "දිනමිණ" සාහිත්‍ය අතිරේකය හෝ සංස්කෘතියේ හා සාහිත්‍ය වින්දනය මේ රටේ එදිනෙදා චින්තනයේ වෙනසක් කරවන සංස්කෘතික ආම්පන්නය. (Cultural Instrument) බවට පත්විය හැකිය. ඒ අනුව පවතින සමාජයේ දැනුම කළමනාකරණය කරමින්, ජනවිඥාන සංවිධානය (organization of the collective memory of society) කළ හැකි වෙනු ඇත. එහිදී "දිනමිණ"ට සිය මාධ්‍ය මෘදුකාංගය (Media (chip) hardware) බවට සාහිත්‍යය විශේෂාංගය භාවිතා කළ හැකිය. මෙහිදී "දිනමිණ"ට මේ සමාජයේ සංස්කෘතික අනන්‍යතාව ඇතිවිය හැක්කේ කෙසේද සොයා එම අනන්‍යතා මඟින් විරෝධාකල්පනය හෝ සමාජසත්ථා යථාර්ථවාදය යැයි කියමින් ඊනියා මතවාද මගින් දූෂණය කරවන මෙරට ග්‍රාහක මනස්වලට අභියෝග කළ හැකිය. එයට එරෙහිව දුෂ්පන්න ව්‍යවහාර හෝ අවි අමෝරා ගන්නවාට වඩා කිසියම් සංස්කෘතික සදාචාරයක් මත බිහි කළ මතවාදයකින් ඒවා පරාජය කළ හැකිය. ඒ සඳහා "දිනමිණ" මෙතෙක් කරගෙන ආ ඒ සදාචාරාත්මක හා නිර්මාණාත්මක සාහිත්‍යය සම්පත් වර්ධනය අදට වඩා හෙට හොඳ කරගත හැකි වෙනු ඇත.

චම්මින්ද වෙලගෙදර

60% දක්වා වට්ටම්

0% පොලියට පහසු ගෙවීම් ක්‍රම

0%ක පොලියකට BALANCE TRANSFER පහසුකම

ආරම්භක සහ වාර්ෂික ගාස්තු නැත

ස්ථාවර තැන්පතු මත ලබාදෙන ක්‍රෙඩිට් කාඩ් සඳහා 12%ක අඩුම පොලී අනුපාත

ක්‍රෙඩිට් කාඩ් මත ණය පහසුකම්

# PEOPLE'S Discount දෙසැම්බරේ

මේ උත්සව සමයේ
පීපල්ස් ක්‍රෙඩිට් කාඩ් වෙතින් ආකර්ෂණීය වට්ටම්

කොන්දේසි සහිතයි

## නිමිඇඳුම්

### 20%

- CIB Shopping Centre — දෙසැ. 21 සහ 22 — Credit : 20%
- CIB Curtains — දෙසැ. 21 සහ 22 — Credit : 20%
- Claire's Closet — දෙසැ. 21 සහ 22 — Credit : 20%
- Chamathkara — දෙසැ. 1 සිට 31 දක්වා — Credit : 20% Debit : 20%
- Hi Life — දෙසැ. 12 සහ 13 — Credit : 20% Debit : 10%
- Hameedia — දෙසැ. 28 සහ 29 — Credit : 20%
- Handloom Gallery — දෙසැ. 12, 13 සහ 22 — Credit : 20% Debit : 10%
- House of Fashions — දෙසැ. 11, 13, 18 සහ 29 — Credit : 20%
- The Kids Warehouse — දෙසැ. 11 සහ 12 — Credit : 20%
- Prasad Fashion Square — දෙසැ. 24 සහ 25 — Credit : 20%
- Prasad Textiles — දෙසැ. 24 සහ 25 — Credit : 20% Debit : 10%
- Saman Mal — දෙසැ. 25 සිට 27 — Credit : 20% Debit : 15%
- Sarathchandra Textiles — දෙසැ. 19 සහ 20 — Credit : 20% Debit : 10%
- Saree Mandir — දෙසැ. 12 සහ 13 — Credit : 20% Debit : 15%
- Signature — දෙසැ. 28 සහ 29 — Credit : 20%
- Spring & Summer — දෙසැ. 10 සහ 11 — Credit : 20% Debit : 10%
- Sriyani Dress Point — දෙසැ. 23 සහ 24 — Credit : 20%
- Sunimal's — දෙසැ. 11 සිට 13 — Credit : 20%
- Super Fashion (Panadura) — දෙසැ. 20 සහ 21 — Credit : 20% Debit : 10%
- Wijaya Saree Mandir — දෙසැ. 21 සහ 22 — Credit : 20%
- Nike — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- International Watches — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Mango — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Levi's — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Crocs — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Mothercare — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Sacoor Brothers — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Fossil — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Tommy Hilfiger — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Galleria — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Aldo — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Clarks (Colombo City Centre) — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Armani Exchange — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Jack & Jones — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Diesel — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Luxe Bags — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Love Moschino — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Yamamay — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Furla — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Hallmark — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Adidas Performance (One Galle Face Mall) — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- The Toy Store — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- American Tourister — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Adidas Originals (One Galle Face Mall) — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Shechers (One Galle Face Mall) — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- GUESS — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Vero Moda (One Galle Face Mall) — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- Carpisa (One Galle Face Mall) — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- ASICS — දෙසැ. 26 සහ 27 — Credit : 20% Debit : 10%
- U.S. Polo — දෙසැ. 26 සහ 27 — Credit : 20% Debit : 10%
- Aurelia — දෙසැ. 26 සහ 27 — Credit : 20% Debit : 10%
- W — දෙසැ. 26 සහ 27 — Credit : 20% Debit : 10%
- Reebok — දෙසැ. 26 සහ 27 — Credit : 20% Debit : 10%
- Puma — දෙසැ. 26 සහ 27 — Credit : 20% Debit : 10%
- Fila — දෙසැ. 26 සහ 27 — Credit : 20% Debit : 10%
- Inc. 5 — දෙසැ. 26 සහ 27 — Credit : 20% Debit : 10%
- Red Tape — දෙසැ. 26 සහ 27 — Credit : 20% Debit : 10%
- Clarks - DSI — දෙසැ. 26 සහ 27 — Credit : 20% Debit : 10%
- Von Wellx Germany — දෙසැ. 26 සහ 27 — Credit : 20% Debit : 10%
- DSI Premier (All outlets) — දෙසැ. 26 සහ 27 — Credit : 20% Debit : 10%
- GCS Fashions (Polonnaruwa) — දෙසැ. 19 සහ 20 — Credit : 20% Debit : 10%
- Galle City Stores (Polonnaruwa) — දෙසැ. 19 සහ 20 — Credit : 20% Debit : 10%
- Dilly & Carlo (One Galle Face Mall) — දෙසැ. 18 සිට 20 — Credit : 20% Debit : 10%
- Kreation (All outlets) — දෙසැ. 12 සිට 19 — Credit : 20% Debit : 15%
- Cotton Island (One Galle Face Mall) — දෙසැ. 21, 22 සහ 31 — Credit : 20% Debit : 10%
- Cotton Collection — දෙසැ. 23 සහ 24 — Credit : 20% Debit : 10%
- amante (One Galle Face Mall) — දෙසැ. 9 සහ 10 — Credit : 20% Debit : 10%
- One Plus One (Kandy) — දෙසැ. 18 සහ 19 — Credit : 20% Debit : 10%

### 25%

- The Factory Outlet — දෙසැ. 26 සහ 27 — Credit : 25% Debit : 15%
- The Brands Warehouse — දෙසැ. 15 සිට 17 දක්වා — Credit : 25% Debit : 15%
- Avirate — දෙසැ. 14 සහ 15 — Credit : 25% Debit : 20%
- Inter Fashion — දෙසැ. 13 සහ 19 — Credit : 25% Debit : 10%

### 15%

- Piyarathna Tex — දෙසැ. 23 සහ 24 — Credit : 15%
- Cool Planet — දෙසැ. 14 සහ 21 — Credit : 15% Debit : 10%
- Haamaa — දෙසැ. 18 සහ 19 — Credit : 15% Debit : 10%
- New Manel — දෙසැ. 19 සහ 20 — Credit : 15% Debit : 10%
- Tissot — දෙසැ. 23 සහ 24 — Credit : 15% Debit : 10%
- Minuk Fashion (Wellawaya) — දෙසැ. 18 සහ 19 — Credit : 15%
- Keyana Department Store (Nugegoda) — දෙසැ. 19 සහ 30 — Credit : 15% Debit : 10%
- XIMI VOGUE — දෙසැ. 14 සහ 21 — Credit : 15% Debit : 10%
- Exibit — දෙසැ. 14 සහ 21 — Credit : 15% Debit : 10%
- Nirmani Dress Point — දෙසැ. 22 සහ 23 — Credit : 15% Debit : 10%

### 10%

- Longines — දෙසැ. 23 සහ 24 — Credit : 10% Debit : 10%

### 0%

මාස 36ක් දක්වා
පහසු ගෙවීමේ ක්‍රම
මෙම වෙළඳ සැල්වලදී
2020 දෙසැම්බර් 31 දක්වා (Call and convert)

Abans & Abans Elite, Damro, wasi.lk, bigdeals.lk, buyabans.com, Dinapala, onopicks.com, Hameedia, Vision Care, CameraLK, Singer, Morich, daraz.lk, mysoftlogic.lk, Softlogic & Softlogic Max Showrooms, J.M. Wickramarachchi & Co., catchme.lk, Seetha Holdings, Premadasa Jewellers, Raja Jewellers, Fior Drissage Jewellers, Mallika Hemachandra, odel.lk, Quantum Fitness, EDUCATION INSTITUTES (Including Private Universities)

අදම ඔබේ පීපල්ස් ක්‍රෙඩිට් කාඩ් පත අයදුම් කරන්න.

2020 නත්තල් සමය සඳහා වලංගු වේ.

www.peoplesbank.lk

1961 PEOPLE'S BANK CALL CENTRE

PEOPLE'S BANK
The Bank of the People

AA+ (lka) Fitch Rating, AAA- Brand Finance Rating
People's Bank is a licensed commercial bank supervised by the Central Bank of Sri Lanka.

# පාඨක විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව වර්ෂ 1815 බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්වීමෙන් පසුව ලාංකිකයන් නිදහස පතා බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ගෙන ගිය සන්නද්ධ අරගලවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වුණි. බ්‍රිතාන්‍යයන්ට එරෙහිව දියත් වූ 1818 කන්ද උඩරට කැරැල්ල සහ 1848 මාතලේ කැරැල්ල අසාර්ථක විය. මෙම පසුබිම් මත භික්ෂූන් වහන්සේ ප්‍රමුඛ මෙරට ගිහි පැවිදි දේශමාමක ජනයා නිදහස දිනා ගැනීම පිණිස නියැළී සිටි ආයුධ සහිත කැරලිකාර සටන් ව්‍යාපාරයෙන් ඉවත්වීමට තීරණය කළ බව පෙනේ. ඒ වෙනුවට උන්වහන්සේලා බ්‍රිතාන්‍යයන්ගේ මර්දනකාරී පාලනයට එරෙහිව ද මිෂනාරීන්ගේ ආගමික හා සංස්කෘතික ව්‍යාප්තවාදයට එරෙහිව ද මතවාදීව ලාංකිකයන් පෙළ ගැස්වීමට පෙලඹුණි.

මෙහි දී බ්‍රිතාන්‍යයන්ට එරෙහිව ලාංකිකයින් ගෙන ගිය මතවාදී අරගලයේ ප්‍රධාන සන්නිවේදන මෙවලම බවට පත් වූයේ පුවත්පතයි. ඒ අනුව පුවත්පත ලාංකිකයන් ගෙන ගිය ජාතික ආගමික අරගලයේ ප්‍රධාන මතවාදී උපකරණය බවට පත්විය. නොබෝ කලකින් පුවත්පතට මෙරට ජාතිමාමක, දේශමාමක සියළු ගිහිපැවිදි බලවේග බ්‍රිතාන්‍යයන්ගේ විනාශකාරී පාලනයට එරෙහිව ගොනු කිරීමට හැකිවුණි. මෙහි දී අහිමි වී ගිය ජාතික ආගමික නිදහසේ වටිනාකම පිළිබඳ ලාංකිකයන්ට පහදා දීමට ද පුවත්පතට හැකිවිය. එමෙන්ම පුවත්පත එවක ජීවත් වූ ලාංකිකයන්ට නිදහස් හා නිවහල් ජාතියක් ලෙස ජීවත්වීමේ අගය වටහා දීම පිණිස ද උත්සුක වූ බව පෙනේ. මෙරට ජාතික, ආගමික නිදහස් අරගලයට පණ පෙවීම සඳහා යොමු වී සිටි විවිධ ධාරාවන්ගේ පුවත්පත්වල කාර්යභාරය විමසා බැලීම මගින් මේ බව සනාථ වේ.

මෙම පුවත්පත් ගොන්න ඒ අතරින් වර්ෂ 1909 දෙසැම්බර් 17 එච්.එස්. පෙරේරා මහතාගේ කර්තෘත්වයෙන් ප්‍රකාශයට පත් කෙරුණ 'දිනමිණ' පුවත්පත ප්‍රමුඛත්වයෙහි ලා දැක්වීමට පිළිවන. එකළ ප්‍රකාශයට පත් කෙරුණ සිංහල ජාතිය, සිංහල බෞද්ධයා, සරසවි සඳරැස, දිනපතා ප්‍රවෘත්ති වැනි සමකාලීන පුවත්පත් සමඟ එක්වී නව 'දිනමිණ' පුවත්පත ජාතික ආගමික නිදහස් අරගලය සඳහා උචිත වන පරිදි ජනමනස සංවිධානය කළේය. හේමචන්ද්‍ර සේපාල පෙරේරා හෙවත් එච්.එස්. පෙරේරා දිනමිණ පුවත්පත් ප්‍රකාශයට පත් කරන්නේ ද මෙම පුවත්පත ප්‍රකාශයට පත් කිරීම සඳහා ඩී.බී. ජයතිලක වැනි ජාතිමාමක ප්‍රගතිශීලීන් උපකාර කරන්නේ ද රත්මලානේ ශ්‍රී ධර්මාරාම හිමිපාණන් අභිනව පතට නම යොදන්නේ ද 'දිනමිණ' නමැති මෙම නව පුවත්පතට පාඨකයා උදෙසා අනාගතයේ සිදුකිරීමට විශාල කාර්යභාරයක් පවත්නා බව ඔවුන් පූර්වයේ වටහා ගත් බැවිනි.

"ඉතා බලසම්පන්න දිනපතා පත්‍රයක් නැතිකම සිංහල ජාතියට අගෞරවයකි. අවශ්‍යයෙන් වුවමනා තුබූ මේ වැඩේ මෙසේ ඉෂ්ට වනු දැක්ම අපටත් බලවත් ප්‍රීතියකි. රටට ජාතියට, ආගමට හිතෛෂී සියලු භවතුන් විසින් මෙම පත්‍රයට කලින්ම දායක වන්නාහයි බලාපොරොත්තු වම්හ. මේ සම්බන්ධ ලියකියමන් කොළඹ, ලංකාභිනවවිශ්‍රැත යන්ත්‍රාලයේ 'දිනමිණ' කළමනාකාර මහතාට යැවිය යුතුය."

මේ වර්ෂ දිනමිණ පුවත්පතේ බිහිවීම සම්බන්ධයෙන් එවක සමකාලීන මුද්‍රිත ප්‍රකාශනයක් වූ 'සිංහල ජාතිය' පුවත්පතෙහි 1901.12.01 කෙරුණු වාර්තාවකින් උපුටා ගත් කොටසකි. මෙයින් ලාංකීය ජාතිකත්වයට පණ පෙවිය හැකි දිනමිණ වැනි නව පුවත්පතක අවශ්‍යතාව විශද වේ.

එමෙන්ම 1909 දෙසැම්බර් 17 වන දින ප්‍රකාශයට පත් වූ දිනමිණ පුවත්පතේ පළමු කර්තෘ වාක්‍යයේ මෙලෙස සඳහන් වේ. .

"ශ්‍රී ලංකාද්වීපවාසී සිංහල මහජනයා අතර මෙකළ පවත්නා දියුණුවට ප්‍රවෘත්ති පත්‍ර අතිශයෝපකාරී වූ බැව් රටේ තොරතුරු දන්නා කාටත් ප්‍රත්‍යක්ෂ විය යුතු සත්‍යයකි. ශාස්ත්‍ර ඥානයෙන් ද වෙළහෙළදාම් කෘෂිකර්මාදියෙන් ද ස්වදේශවාත්සල්‍යය ආදී ජාතියක් උසස් වීමට හේතු වූ ගුණ ධර්මයෙන් ද අපේ සිංහල ජන සමූහයා ගත වූ ශතසංවත්සරාර්ධය තුළ සැලකිය යුතු ප්‍රමාණයකට දියුණුව සිටින බැව් කිය යුතු ය............

...... ලංකාද්වීපයෙහි පමණක් නොව අන්‍ය දේශවල ද ජාති උන්නතිය සඳහා ප්‍රවෘත්ති පත්‍ර ඉවහල් වී තිබේ. කරුණු මෙසේ බැවින් සිංහල භාෂාවෙන් පළ කරනු ලබන දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක් ආරම්භ වීම කාලානුරූප ක්‍රියාවක් ලෙස රටට ජාතියට හිතැති කවුරුත් කල්පනා කරත් යැයි අපේ විශ්වාසයයි...... තවද නිකායකට, පක්ෂයකට හෝ සමාගමකට බැඳීමක්වත් යටත්වීමක්වත් නොමැති හෙයින් කවර කරුණක දී වුවත් සත්‍යයත් යුක්තියත් පමණක් භාජනය කිරීමෙන් සාධාරණ ගුණයෙහි පිහිටා.........."

මෙමගින් පාඨකයාට දිනමිණ පුවත්පතේ දැක්ම සහ ගමන්මග පිළිබඳ යම් වැටහීමක් ඇතිකර ගැනීමට හැකි ය. එමෙන්ම පුවත්පතේ මෙහෙවර සහ කාර්යභාරය කුමක් විය යුතු ද යන්න පිළිබඳව හඳුනා ගැනීමට පිළිවන. දිනමිණ පුවත්පත ආරම්භ කළ යුගය වන විට මෙරට පුවත්පත් මගින් ඉටුකළ යුතු යැයි අපේක්ෂිත සමාජ මෙහෙවර මෙන්ම පාඨකයා පුවත්පත වෙතින් අපේක්ෂා කරනු ලබන දේ පිළිබඳ යම් විනිශ්චයක් ඇතිකර ගැනීමට ඉහත උපුටනය මහෝපකාරී වේ.

මෙමගින් පැහැදිලි වන්නේ දිනමිණ පුවත්පත ජාතික ආගමික අරගලයට මෙරට ප්‍රජාව මතවාදීව සහභාගී කරවා ගැනීමට අවශ්‍ය නායකත්වය සැපයීම මෙන් ම පාඨකයාට යහපත් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය ඥාන දායාදය සැපයීම සඳහා ක්‍රියාත්මක වී ඇති බවයි. එමෙන්ම ආරම්භක මොහොතේ පටන් දිනමිණ පුවත්පතට සුවිශාල සමාජ කාර්යභාරයක් පැවරී තිබුණ බව මේ ඔස්සේ විනිශ්චය කළ හැකි ය. දිනමිණ පුවත්පතේ පළමු කර්තෘ වාක්‍යයේ දැක්වෙන පරිදි පහත දැක්වෙන අරමුණු උදෙසා පාඨකයා පෙළගැස්වීම වෙනුවෙන් සියවසකට අධික කාලයක් පුරා දිනමිණ පුවත්පත කටයුතු කරමින් සිටින බව පෙනේ.

**ශාස්ත්‍රඥානය වර්ධනය කිරීම**
**වෙළඳ කටයුතු පවත්වාගෙන යාම**
**කෘෂිකාර්මික කටයුතුවලට සහාය වීම**
**ස්වදේශික වාත්සල්‍යය ගොඩනැඟීම**
**ගුණධර්ම වර්ධනය කිරීම**

මෙරට ජාතික ආගමික නිදහස් අරගලය උදෙසා පාඨක ප්‍රජාව සංවිධානය කළ තැන් පටන් වර්තමානය දක්වා දිනමිණ පුවත්පතේ ගමන්මග පසුකරන ලද සංධිස්ථාන කිහිපයකි.


වර්ෂ 1901 දෙසැම්බර් 17 පුවත්පතේ බිහිවීම හා එච්.එස්. පෙරේරා යුගයේ ආරම්භය

වර්ෂ 1914 ඩී.ආර්. විජේවර්ධන මහතා පුවත්පතේ අයිතිය මිල දී ගැනීම සහ විජේවර්ධන යුගයේ ආරම්භය

වර්ෂ 1950 ජූනි 13 ඩී.ආර් විජේවර්ධන මහතා මියයාම සහ පුවත්පතේ අයිතිය රංජිත් විජේවර්ධන මහතාට පැවරීම

වර්ෂ 1973 ජූලි 20 පුවත්පතේ අයිතිය රජයට පවරා ගැනීම

දිනමිණ පුවත්පත පසුකළ මෙම සංදිස්ථානවලට අනුව




පුවත්පතේ දර්ශනය මෙන්ම මතවාද වෙනස් වූ ආකාරය ද පුවත්පතේ ආකෘතිය සහ අන්තර්ගතය වෙනස් වූ ආකාරය ද ඉතා ගැඹුරින් සාකච්ඡා කළ යුතු හෙයින් මෙය ඒ සඳහා අවස්ථාවක් කර නොගනිමි. නමුත් දිනමිණ සිය හිමිකාරීත්වය පිළිබඳ මේ සියලු පරිවර්තන හමුවේ සහ තත්කාලීනව ඇති වූ දේශපාලන, ආර්ථික පරිවර්තන හමුවේ සිය ජාතික වගකීම මැනවින් ඉටුකරමින් සිටින බව පෙනේ.

මෙහි දී දිනමිණ පුවත්පතට විශේෂ වූ අනන්‍යතාව ආරක්ෂා කරගනිමින් එය ප්‍රකාශට පත්කිරීමට කාලයෙන් කාලයට පුවත්පතේ කර්තෘත්වය දැරූවන් සහ සෙසු මාධ්‍යවේදීන් කටයුතු කර ඇත. එබැවින් පුවත්පත මෙහෙය වූ සෑම කතුවරයෙක්ම කුමන බාධක හමුවේ වුවද දිනමිණ අනන්‍යතාව ආරක්ෂා කිරීම වෙනුවෙන් කැප වී කටයුතු කර තිබේ. සියවසකට අධික කාලයක් මුළුල්ලෙහි ජනතා මෙහෙවරක නියැළී සිටින දිනමිණ පුවත්පත නිර්මාණශීලීව ද, දෘෂ්ටිවාදීව ද සංවිධානය කර ඇති ආකාරය එම පුවත්පතේ ඉතිහාසය විමර්ශනය කිරීමේ දී පෙනීයයි. ඒ අනුව ආරම්භක යුගයේ පටන් පුවත්පතේ අන්තර්ගතය පහත ක්ෂේත්‍ර ඔස්සේ ගුණාත්මක බව ද ආරක්ෂා වන පරිදි සකස් කර ඇති බව පෙනේ.

විදෙස් තොරතුරු
ජ්‍යොතිෂය තොරතුරු
උසාවි වාර්තා
රටතොට සිදුවීම්
**වෙළඳ දැන්වීම්**
**දේශපාලන සිදුවීම්**

ඒ අනුව දිනමිණ පුවත්පත ප්‍රවෘත්ති, විශේෂාංග ලිපි මෙන් ම තීරු ලිපි ආදිය නිර්මාණය කිරීමේ දී කුමන සමාජ, දේශපාලනික සහ සංස්කෘතික සන්දර්භයක් යටතේ වුව ද විදග්ධ මාධ්‍ය මාධ්‍ය සම්ප්‍රදාය ආරක්ෂා කර ගැනීමට කටයුතු කර ඇත. දිනමිණ පුවත්පත විජේවර්ධනලාගේ හිමිකාරිත්වය යටතේ වුවද පසුව රාජ්‍ය හිමිකාරිත්වය යටතේ වුවද සිය වාර්තාකරණ සම්ප්‍රදාය උල්ලංඝනය නොකළේ ය. දිනමිණ ඉතා පු`ළුල් ලෙස මෙරට පක්ෂ දේශපාලන අවශ්‍යතා ඉටුකරමින් සිටින පුවත්පතක් වුව ද හැකි සෑම අවස්ථාවකදීම ලැබෙන සීමිත ඉඩ වුවද පාඨකයාගේ රස ජනනය සඳහා ද ඥාන වර්ධනය සඳහා ද යොදා ගැනීම දිනමිණ පුවත්පතේ සිරිතකි. දිනමිණ දේශපාලනීකරණය වී ඇතැයි ඇතමෙකු චෝදනා කළ ද මෙරට ප්‍රබුද්ධ පාඨක සම්ප්‍රදාය සැමදා ආරක්ෂා කළේ දිනමිණ පමණකැයි කීම අතිශෝක්තියක් නොවේ. මෙරට පුවත්පත් සම්ප්‍රදාය තුළ ජනමාධ්‍ය ආචාරධර්මීය පදනම ආරක්ෂා කරන ලද්දේ දිනමිණ පුවත්පතයි.

පුවත්පත් භාෂාව ප්‍රමුඛ සෙසු නිර්මාණශීලී අංග පෝෂණය සඳහා ද දිනමිණ අපරිමිතව දායක වෙමින් සිටියි. ඒ අනුව දිනමිණ පුවත්පත තුළ විවිධ භාෂා ශෛලීන් භාවිතයට ගනු ලබන අකාරය හඳුනාගත හැකි ය.

**වාර්තාමය හෙවත් ප්‍රකාශන භාෂා ශෛලිය**
**නිර්මාණාත්මක භාෂා ශෛලිය**
**ශාස්ත්‍රීය භාෂා ශෛලිය**

ඒ අනුව දිනමිණ පුවත්පත තුළ මෙම භාෂා ලක්ෂණ දක්නට ලැබේ. මේ භාෂා ශෛලීන් පාඨක අවශ්‍යතා මැනවින් ඉටු කිරීම උදෙසා භාවිත කිරීම දිනමිණ පුවත්පතේ ලක්ෂණයකි. අපගේ පැරණි පුවත්පත් සම්ප්‍රාදය තුළ පුවත්පතක සේවය සඳහා මාධ්‍යවේදිකයකු ලෙස එකතු වන නවකයන්ට භාෂා භාවිතය සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදීන් ලබාදුන් උපදේශය වූයේ 'මල්ලි..ජේම්ස් අයියාටත් තේරෙන භාෂාවෙන් ලියන්න' යන්නයි.

මෙයින් කියැවෙන්නේ පුවත්පත් භාෂාව සෑම තරාතිරමකම පාඨකයින්ට පහසුවෙන් කියවා අවබෝධ කර ගැනීමට හැකි ගුණයක් පැවැතිය යුතු බවයි. ඕනෑම සංකීර්ණ හා ගැඹුරු විෂය කරුණක් සරලව හා රූපාකාරව ඒත්තු ගැන්වීමට හැකි වන පරිදි දිනමිණ පුවත්පත සිය භාෂාමය මෙහෙවර ඉටු කරමින් සිටියි.

"රාත්‍රී නින්දට යන වේලාව පැමිණුනාම සයනාසනය අතුරන්නේ ය. සියලු වැඩ කිරීමට කන්‍යාවුන් පත්කර තිබේ. ඇතැම් හෝටල්වල හත්අට දෙනෙක් සිටින්නීය. ඉතාම පවිත්‍ර අන්දමට ඇඳ පැලඳ ප්‍රීති මුහුණුවලින් සිනා පහල කරමින් මේ කන්‍යා කොටස විසින් සියලු කෘත්‍ය කරනු ලැබේ. පාන්දර 5 පටන් ? 12 දක්වා කෘත්‍යයන්හි යෙදෙන්නියෝ ය. නාන ශාලාවේ ලීවලින් කරන ලද භාජනයක සෑම වේලේම උණ්හොදකයෙන් පරිපූර්ණයි. ආහාර ගැනීම බිම වාඩිගෙනයි. සූප ව්‍යංජන තුනක් හතරක් සමඟ බත් අනුභව කිරීම කරන්නේ ය. හෝටලයේ නැවතී සිට යන විට හෝටලයට ගෙවන ගණන හැර මේ කන්‍යවුන්ගේ ප්‍රයෝජනයට 'මඩයි' කියා සතුටින් ගණනක් ගෙවීම කරති. මෙය චාරිත්‍ර ධර්මයකි."

1913 ජුනි 10 දිනමිණ, පිටුව 03

මේ ජපන් සංචාරයක තතු විත්ති ඇසුරෙන් අනගාරික ධර්මපාලතුමන් විසින් දිනමිණ පුවත්පතට ලියා එවන ලද ලිපියකි. ලේඛකයා තමන් අත්විඳි අත්දැකීමක් ඉතා සරල ලෙස පැහැදිලි කරයි. මෙය දිනමිණ පුවත්පත හඳුන්වාදුන් ලේඛන සම්ප්‍රදායේ ලක්ෂණයකි.පහතින් දැක්වෙන්නේ දිනමිණ පුවත්පතේ පළ වූ 'කට' නමින් ලියැවුණු තීරු උපුටා ගත් කොටසකි.

"පෘථිවි" ධාතුව නම් ස්තම්බ ගුණයක් බව ද "අප" යනු වැගිරෙන ගුණක් බව ද "තේජෝ" යනු උෂ්ණ ශීත ගුණමය බව ද මේ කටට තේරෙයි.

තර්ක ශාස්ත්‍රයට මඳක්වත් කට නොගසා එය කොටනකට කර නැත යනු කුමක්දැයි නොදැන භූත ගැන අභූත බිණීම කොයි කටකට වුවත් නොකට හැකි නොවන බව ද මේ කටට වැටහී යයි."

දිනමිණ පුවත්පත සිය ඉතිහාසය ගෙවා දැමුවේ විවිධ හිමිකරුවන්ගේ පාලන තන්ත්‍රවලට නතුවෙමිනි. වර්ෂ 1973 සිට දිනමිණ පාලනය වන්නේ රාජ්‍ය හිමිකාරීත්වය යටතේය. එහි ප්‍රතිඵලයක් ලෙස දිනමිණ පුවත්පත සඳහා මෙරට පක්ෂ දේශපාලනික මුහුණුවර ආරෝපණය වී ඇත. නමුත් කුමන දේශපාලන සන්දර්භයක් මධ්‍යයේ වුවද දිනමිණ පුවත්පත ස්වකීය සමාජීය මෙහෙවර නොපිරිහෙළා ඉටු කරමින් සිටියි. දිනමිණ පුවත්පතේ ඓතිහාසික හා සමකාලීන මෙහෙවරට සුබ පැතුම් එක් කරන්නේ දිනමිණ මංගල කලාපයේ පළ වූ කාව්‍යමය නිර්මාණයකින් එක් කවියක් උපුටා දක්වමිනි.

ලකට සෙත් වේවා
දිනමිණ දියුණු වේවා
දුසිරි දුරු වේවා
සිහල දන ගණ සමඟි වේවා

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**සමන් රාජපක්ෂ**
**ජනසන්නිවේදන අධ්‍යයන අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**



# පත්තරයත් භාණ්ඩයකි!

ප්‍රවත්පත සම්බන්ධයෙන් පැවැති ආකර්ෂණය, ආධිපත්‍යය, බලය, පිළිගැනීම හා අලෙවිය පිරිහී ඇත. එය තවදුරටත් ශීඝ්‍රාකාර ප්‍රපාතයක් කරා ගමන් කරමින් සිටී. කොවිඩ් ලෝක වසංගතය එය තවත් පිම්මකින් ප්‍රපාතය කරා සමීප කර ඇත. වසංගතය තුළ දෘශ්‍ය මාධ්‍ය යම් පමණකින් සිය ආර්ථික ලාභ වැඩි කර ගත්තේය. වසංගතය තුළ මුද්‍රිත මාධ්‍යය තවදුරටත් අලාභ ලබන තත්ත්වයට ඇද වැටිණි. අමෙරිකාවේ මුද්‍රිත මාධ්‍ය ආයතන තුන්සියයක් සිය පැවැත්ම සඳහා ණය ගෙන ඇතැ'යි සඳහන්ය.

යුරෝපීය පත්තර කලාවේ පිරිහීම ගැන කතිකාව ආරම්භ වන්නේ 2000 ගණන්වල සිටය. 2005 වසර එහි සන්ධිස්ථානයක් ලෙස සටහන් වී ඇත. පාඨකයෝ අඩු වෙති. ප්‍රේක්ෂකයෝ වැඩි වෙති. යන්න එදා පැවැති විවරණය වෙයි. අනාගතය ඩිජිටල් තාක්ෂණයට භාර වෙයි යන්න ඊළඟ යෙදුම වෙයි. ඩෙන්මාර්කය අතීතයේදී හැඳින්වූයේ 'ද ලෑන්ඩ් ඔෆ් නිව්ස්පේපර් රීඩින්ග්ස්" යනුවෙන්ය. එහෙත් අද වන විට එහි එවැන්නක් නැත. උතුරු යුරෝපයේ පත්තර අලෙවිය අඩු වී ඇත. මධ්‍යම යුරෝපයේ ද පත්තර අලෙවිය අඩු වී ඇත. නැගෙනහිර යුරෝපය ද එම තත්ත්වයට මුහුණ දෙමින් සිටී.

අමෙරිකාව, ජපානය, චීනය, ඉන්දියාව පුවත්පත් සම්බන්ධයෙන් යම් ආර්ථික ශක්තියක් පවත්වාගෙන සිටි නමුදු කොවිඩ් තත්ත්වය තුළ එය ද අභියෝගයට ලක් වී ඇත.



දෙදහස් ගණන්වලදී මතු වූ පුවත්පත් කර්මාන්ත අර්බුදයේ කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් තිබිණි.

(i) පුවත්පත් අලෙවිය පහත බැසීම

(ii) පත්‍රකලාවේදීන්ගේ රැකියා අහිමි වීම

(iii) දැන්වීම් හා අතිරේක අඩු වීම

(iv) කීර්තිනාමය හා පිළිගැනීම ක්ෂය වීම

රටවල් කිහිපයක් මූලික කොට සිදු කරන ලද සමීක්ෂණ කිහිපයක ප්‍රතිඵලවලට අනුව 2007 - 2009 කාලසීමා තුළ අමෙරිකාවේ 30% කින් ජපානයේ 18% කින්, ග්‍රීසියේ 20% කින් කැනඩාවේ 17% කින් හා එංගලන්තයේ 25% කින් පත්තර අලෙවිය පහළ බැස තිබේ. ෆෙයාර්ෆැක්ස් නම් මාධ්‍ය පර්යේෂණ ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ජැක් මැතිව්ස් පෙන්වා දෙන අන්දමට පත්තරයට ආයුබෝ කියා ඩිජිටල් මාධ්‍ය වෙත නැඹුරු වන පිරිස ශීඝ්‍රයෙන් ඉහළ යති. එය කිසිවකුටත් වැළැක්විය නොහැකි සාධකයක් ලෙස පවතී.

ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ රැකියා අහිමි වීම බරපතළ ගැටලුවක් ලෙස පවතී. විශේෂයෙන් වාර්තාකරුවන් හා විශේෂාංග රචකයන් වෙනත් රැකියාවන් කෙරෙහි යොමු විය හැකි පිරිසක නොවේ. ඔවුන්ගේ විශේෂඥභාවය ඇත්තේ තම ක්ෂේත්‍රය තුළ පමණි. 2001 සිට 2010 දක්වා කාලය තුළ එංගලන්තයේ පමණක් පත්‍රකලාවේදීන් 15,000 කට රැකියා අහිමි විය. කොවිඩ් තත්ත්වය යටතේ යළිත් රැකියා කපාහැරීම ආරම්භ වී ඇත. ඊට අදාළ සංඛ්‍යා-දත්ත හෙළිදරව් වීමට තවත් කාලයක් ගත වනු ඇත. රැකියා සුරක්ෂිතතාව පිළිබඳ බරපතළ ගැටලුවක් මුද්‍රිත මාධ්‍ය ක්ෂේත්‍රය තුළ පවතී.

මේ කාලය වන විට පුවත්පතක් මුද්‍රණය කිරීම සඳහා වැයවන පිරිවැය ශීඝ්‍රයෙන් ඉහළට ගොස් තිබේ. කඩදාසි නිෂ්පාදනය සම්බන්ධයෙන් පවතින අර්බුදය ද පත්තර ආයතන නඩත්තු කිරීම සඳහා වැය වන මුදල ද නිෂ්පාදන වියදම් ඉහළ යෑමට හේතුවක් වී තිබේ. පත්තර ආයතන වැඩි වශයෙන් ලුහුඬු දැන්වීම් කෙරෙහි විශ්වාසය තබාගෙන සිටිය ද අන්තර්ජාලය ලුහුඬු දැන්වීම් කෙරෙහි යොමු වීමත් සමඟ පත්තරවලට තරගයකට මුහුණ දෙන්නට සිදු විය. වැඩි වේගයක් සහිත අන්තර්ජාලයට තරගයේ වාසිය හිමිවෙමින් පවතී. කඩදාසිවල මිල ගණන්වලට අනුව අතිරේක පළ කිරීම මගින් ආදායම් ඉලක්ක සපුරාගත නොහැකි බව පෙනී ගොස් තිබේ.

ප්‍රධාන සිදුවීම් වාර්තා කිරීම සම්බන්ධයෙන් ද මත නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ද පුවත්පතට තිබූ ආධිපත්‍යය හා බලය බොහෝ සෙයින්ම දුර්මුඛ වී ඇත. එම බලය පුවත්පත වෙතින් ගුවන් විදුලිය හා රූපවාහිනිය සොරාගත් අතර එකී මාධ්‍ය වෙතින් සමාජ වෙබ්අඩවි සොරා ගත්තේය. පුවත් ක්ෂණිකව නොමිලේ වාර්තා කිරීමට හා මත නිෂ්පාදනය කිරීමටත් සමාජ මාධ්‍ය සමත් වී ඇත. ඒවායෙහි ඇති නිරවද්‍යභාවය, විශ්වාසය, වෘත්තීයභාවය ප්‍රශ්න කිරීමට ලක් වන්නේ වුව පුවත්පතට ඒ සම්බන්ධයෙන් කළ හැකි දෙයක් නැති තරම්ය. ඇතැම් පුවත්පත්වල පවතින නොසැලකිලිමත් වාර්තාකරණය නිසා තත්ත්වය තවදුරටත් බැරෑරුම් වී ඇත.

මේ තත්ත්වයට මුහුණ දිය හැක්කේ කෙසේ ද යන්න පිළිබඳ සංවාදය මාධ්‍ය විශේෂඥයන් අතර ද, පුවත්පත් ආයතනවල ප්‍රධානීන් අතර ද, පත්තර කර්තෘවරුන් අතර ද පවතී. මෙහි දී මතුවන ප්‍රධාන ගැටලු තුනක් කෙරෙහි අවධානය යොමු වී ඇත.

(I) පුවත්පතට හිමි ආකර්ෂණය නැවත ලබාගන්නේ කෙසේ ද?

(II) පුවත්පත්වල අලෙවිය වැඩි කරගන්නේ කෙසේ ද?

(III) වාර්තාකරණය හා ඉදිරිපත් කිරීම පිළිබඳ තරගය ජය ගන්නේ කෙසේ ද?

පුවත්පතට හිමිව තිබූ ආකර්ෂණය හා ආධිපත්‍යය නැවත හිමි කරගැනීම සඳහා නව උපායමාර්ග භාවිත කළ යුතු යැයි එක මතයකින් කියැවේ. තව මතයකට අනුව පුවත්පතේ ඇදවැටීම තාවකාලිකය. එය සමාජ චර්යාවලට අනුව නැවත යථා තත්ත්වයට පත්වනු ඇත. තවත් මතයකින් කියැවෙන්නේ පුවත්පත් මුද්‍රණය හා වාර්තාකරණය ප්‍රාදේශීය වශයෙන් සිදු කිරීම මීට ඇති එක විසඳුමක් බවය.

පුවත්පත් අලෙවිය සම්බන්ධයෙන් නැවත සොයාබැලීම් සිදු වන්නේ නැති තරම්ය. දැනට සිදු වන්නේ ප්‍රධාන ආයතනය සැලැසුම් කිරීම හා පරණ පුරුදු ලෙස පත්තර බෙදාහැරීමය. බෙදාහැරීමේ ජාල ගැන නිරීක්ෂණයක් නැත. පාඨකයන්ට අවශ්‍ය දේවල් ගැන සොයා බැලීමක් ද නැත. වෙළෙඳ දැන්වීම් අඩු වීම කෙරෙහි අවධානයක් ඇත්තේම නැති තරම්ය. වෙළෙඳ ආයතන හා පත්තර ප්‍රධානීන් අතර සාකච්ඡාවක් ද නැත. පුවත්පත් ආයතන වෙළෙඳ සමාගම් හඹා යායුතු තත්ත්වයක් දැන් පවතී. එහෙත් ඒ සඳහා උපායමාර්ග භාවිත කරන පුවත්පත් ආයතන අඩුය.

පුවත්පත භාවිත වන්නේ තොරතුරු දැනගැනීමට පමණක්ම නොවේ. විද්‍යුත් මාධ්‍යවල නැති විශ්ලේෂණයක් පුවත්පතින් අපේක්ෂා කෙරේ. පුවත්පතේ රචනාවල ඇති ශෛලිය, ආකර්ෂණය හා නිර්මාණාත්මක භාවය මෙහිලා විශේෂ වෙයි. හෙඩිම, ශෛලිය හා පිටු සැලැසුම් මත පුවත්පතක ආකර්ෂණය පවතින බව ද එය අලෙවියට සෘජු බලපෑමක් කරන බව ද පිළිගත් මතය වෙයි.

පුවත්පතේ පුනර්ජීවනය සඳහා පර්යේෂණ ආයතන විසින් නිර්දේශ කරන ලද කරුණු කිහිපයක් තිබේ.

(I) ප්‍රශස්ත වාර්තාකරණය හා වෘත්තීය සංස්කරණය

(II) ගවේෂණාත්මක වාර්තාකරණය හා වැදගත් අන්තර්ගතය

(III) බෙදාහැරීමේ ජාලය නැවත සකස් කිරීම

(IV) දැන්වීම් සඳහා නව උපායමාර්ග සෙවීම

(V) තරුණ පරපුරේ ආකර්ෂණය දිනා ගැනීම

ප්‍රශස්ත වාර්තාකරණය හා වෘත්තීය සංස්කරණය පිළිබඳ සංවාදයක් යුරෝපීය පත්තර කලාව තුළ පවතී. පත්තර සංගම් කිහිපයක් මීට අදාළ සම්මන්ත්‍රණ පවත්වයි. එහිදී මතු වූ ප්‍රධාන කාරණයක් වන්නේ භාෂා භාවිතය අතින් නූතන පත්‍රකලාවේදීන් දුර්වල බවය. ඔවුන් තාක්ෂණයට ගොදුරු වී නිර්මාණාත්මක රචනාවලින් දුරස් වන්නට පටන්ගෙන ඇති බව පිළිගත් මතය වෙයි. ආකර්ෂණීය ලියැවිල්ල මෙන්ම ආකර්ෂණීය සිරස්තල භාවිතය ද කළ හැක්කේ නිපුණ පත්‍රකලාවේදීන්ටය. එය පත්තරයෙන් - පත්තරයට වෙනස් වෙයි. සාර්ථක උපකර්තෘවරුන් තෝරා ගැනීම මීට ඇති කදිම විසඳුම වෙයි.

ගවේෂණාත්මක වාර්තාකරණයට ඇති හොඳම ජන මාධ්‍ය පුවත්පතය. එහෙත් මේ වන විට ගවේෂණය ඇත්වී ඇත. ඒ වෙනුවට ප්‍රභූන්ගේ කතා වාර්තා කිරීමට පමණක් පත්තරකාරයෝ යොමු වී සිටිති. එය වෙනස් විය යුතුය. පත්තරයේ ආත්මය ගවේෂණය විය යුතුය. පත්තර අලෙවිය හා බෙදාහැරීම සඳහා අලුත් කාර්ය-සාධක හමුදාවක් නැතහොත් බළකායක් ඇති කිරීම වැදගත් බව ප්‍රකාශ වී ඇත. ඔවුන් පාඨකයන් හමුවට ගොස් පත්තරය අලෙවි කරන පුද්ගලයන් වීම වඩා වැදගත්ය. පත්තරය ද භාණ්ඩයකි. එය අලෙවි කිරීමට වෙළෙඳ විජ්ජා යෙදිය යුතුය. දැන්වීම් සම්බන්ධ ප්‍රතිපත්ති හා වැඩසටහන් කාලයට ගැළපෙන ලෙස වෙනස් කළ යුතුව තිබේ. මෙහිදී ආයතන සමඟ සාමූහික ගිවිසුම්වලට එළැඹීම වඩා ප්‍රායෝගිකය.

තරුණ පරම්පරාව පත්තර කෙරෙහි ආකර්ෂණය කර ගැනීම විශේෂ කාරණයකි. එය අත්හැරිය හොත් පුවත්පතට අනාගතයක් නැත. මෙය පත්තර ආයතනවල ප්‍රධානීන්ගේ අවධානයට ලක් විය යුතු කාරණයෙකි. එක්තරා පර්යේෂකයකු පෙන්වා දෙන අන්දමට තරුණ පරපුර පත්තර පෙරළා බලන්නට කැමැතිය. ඒවා කියවන්නට අකමැතිය. පත්තරයක් මිලදී ගන්නට කොහොමත්ම කැමැත්තක් ඔවුන් ළඟ නැත. මේ කියමන කරුණු කිහිපයක් හෙළිදරව් කරයි. එක; තරුණ පරම්පරාව පත්තර ප්‍රතික්ෂේප කරන්නේ නැති බවය. දෙක ඔවුන්ට කියවීමට තරම් දෙයක් පත්තරවල නැති බවය. තුන; පත්තර සඳහා මිලක් වැය කිරීමට තරම් වටිනාකමක් එහි නැති බවය.

තරුණයන්ගේ ආකර්ෂණය දිනාගනු ලබන ක්ෂේත්‍ර කවරේදැයි සමීක්ෂණ සිදු කර ඇත. ඒ අනුව ක්‍රීඩාව, විලාසිතා, විනෝද මාර්ග, සෞඛ්‍ය උපදේශන ප්‍රධාන තැනට පැමිණ තිබේ. විකිණීම්, රැකියා අවස්ථා හා අධ්‍යාපනය දෙවන තැනට පැමිණ තිබේ. බොහොමයක් පත්තර දෙස බලනවිට ඉහත සඳහන් ක්ෂේත්‍රවලට දී ඇති ඉඩකඩ ඉතා සීමිතය. පුවත්පතේ ඉඩකඩ ඇහිරෙන විට කපා හරින ක්ෂේත්‍ර ලෙස ද ඉහත විශේෂාංග හැඳින්විය හැකිය.

අපේ පත්තර දෙස ආපසු හැරී බැලුවහොත් පාඨකයන්ට දෙන ඉඩ ප්‍රමාණය ඉතා සීමිතය. ඇතැම් පත්තරවල පාඨකයන් උදෙසා කිසිදු තීරුවක් වෙන් කර නැත. මුල් යුගයේ පත්තරය හැඳින්වූයේ හඬක් නැති පොදු ජනතාවගේ වේදිකාවක් හැටියටය. එහෙත් අද වනවිට තත්ත්වය වෙනස්ය. අතීතයේ පාඨකයාගේ මතයට දුන් තැන දැන් කපා හැර ඇත. එය සාධනීය ලක්ෂණයක් නොවේ. බොහෝ විට අපේ පත්තර පුරාවට ඇත්තේ දේශපාලකයන්ගේ කතාය. ඒවා කියවන්නේ සුළු පිරිසක පමණි. කොවිඩ් වසංගත සමයේ පත්තරවල පිටු පුරාම කොවිඩ් තොරතුරු පළ කිරීම ගැන ද පාඨකයන්ගේ අප්‍රසාදය පළවී ඇත.

සමස්තය දෙස බලන විට පෙනී යන්නේ පත්තර සම්බන්ධයෙන් අතිශය තීරණාත්මක හා අභියෝගාත්මක කාලයක් පැමිණ ඇති බවය. මාධ්‍ය විශේෂඥයන්ගේ මතයට අනුව මෙය ජයගත හැකිය. එය රැඳී ඇත්තේ වෘත්තීය පත්තරකාරයන්ගේ නිර්මාණාත්මක හැකියා මතය.

**රන්ජන් අමරරත්න**

දැන්වීම් කළමනාකරණය - එරන්ද එදිරිමාන්න


ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
MOTORPLUS RIDER



රක්ෂිතයාට රු.100,000ක් දක්වා
පුද්ගල හදිසි අනතුරු ආවරණයක්

රු.25,000 දක්වා වන්දි මුදල්
වැඩකරන පැය 3කින් ලබාදීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
MOTORPLUS TUK



රක්ෂිතයාට රු.100,000ක් දක්වා
පුද්ගල හදිසි අනතුරු ආවරණයක්

රු.40,000 දක්වා වන්දි මුදල්
වැඩකරන පැය 3කින් ලබාදීම

වසරකට රු 5,000 ක උපරිමයක්
දක්වා වූ නොමිලේ ඇදගෙන යාමේ පහසුකම

- පොලී රහිත පහසු ගෙවීම් ක්‍රම රැසක්
- නිවැරදි ඇස්තමේන්තුව අනුව සම්පූර්ණ මුදලම ගෙවීම
- දිවයින පුරා ව්‍යාප්ත 24/7 විශිෂ්ට සේවාව
- SLIC මොබයිල් ඇප් හා www.srilankainsurance.com වෙබ් අඩවිය ඔස්සේ පහසු වාරික ගෙවීම්
- ලෝයල්ටි රිවෝඩ්ස් ඔස්සේ අසමසම දීමනා සහ ප්‍රතිලාභ හිමිවීම

**අදම අමතන්න - 0112 357 357**

SLIC ජංගම දුරකථන යෙදුම ඩවුන්ලෝඩ් කරගන්න

Download on the App Store

GET IT ON Google Play

SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්

★කොත්දේශි සහිතයි


වර්ෂ 2020ක් වූ දෙසැම්බර් මස 17 වැනිදා බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.